
# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව ✻ 2017 දෙසැම්බර් ✻ මෙත් සවිය දහ හතර වන කාණ්ඩය ✻ තිස් එක් වන කලාපය

METHSAVIYA NEWSLETTER

නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙත් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා



ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: කඃ 0714 0144 67, 0112 50 50 88
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org



# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

හෙළදිවට බුදුහිමි වැඩමකර
වසර 2600 ක් සපිරීම
නිමිතිකොට
2012/01/08 වන
දුරුතු පොහෝ දින
ඓතිහාසික මහියංගන
රාජමහා විහාර පුදබිමෙහි
අඩි 84 ක් උසැති
බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙලීම
මෙත් සවිය විසින් අරඹන ලදී.

ඇස්තමේන්තු ගත මුදල
**රුපියල් ලක්ෂ 350 ක්**
පමණ වේ.

## බුද්ධප්‍රතිමා වහන්සේ ඉදිකිරීමේ ඡායාරූප කිහිපයක්...



## මෙම අටමහා කුසල කර්මයට ඔබත් දායකවීමට කැමති නම් විමසන්න

☎ 0714 0144 67, 0112 50 50 88 ✉ office@methsaviya.org

බුද්ධ ප්‍රතිමා වහන්සේ ඉදිකිරීම සඳහා වන සියළුම ආධාර **"සම්පත් බැංකුවේ ( 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා අරමුදල )** නමින් ඇති **"000560001118"** ගිණුමට බැර කරන්න.

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06.
දු:ක: 0714 014467, 0112 505088 වෙබ් අඩවිය : www.methsaviya.org / www.methsaviya.lk විද්‍යුත් තැපෑල : office@methsaviya.org

සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව ❊ 2017 දෙසැම්බර් ❊ මෙත් සවිය දහ හතර වන කාණ්ඩය ❊ තිස් එක් වන කලාපය


## මෙත් සවිය 2017 / 2018 වසර සඳහා මහ සමුළුවේ දී තේරී පත් වූ විධායක කමිටුව

### ගරු පැවිදි අනුශාසක

ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත, වංසාලංකාර අමරපුර නිකායේ
ගරු අධිකරණ සංඝනායක

අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන් වහන්සේ

### ගරු සභාපති

විද්‍යා කීර්ති, ශාසනදීපන, ලෝකාර්ථචාරී, විද්‍යාවාචස්පති, දේශමාන්‍ය, විශ්ව විද්‍යා අධිමනෝවිද්‍යාවේදී, නාලන්දා කීර්ති ශ්‍රී

මහාචාර්ය චන්දන ජයරත්න මහතා.

දු.ක : 0714800800 ෆැක්ස් : 0115678000
විද්‍යුත් ලිපිනය : chandanajayaratne@gmail.com

**ගරු උප සභාපති**

වෛද්‍ය චන්දිම මාරසිංහ මහතා. දු.ක : 071 229 9212
චින්තක බණ්ඩාර මහතා. දු.ක : 071 811 4477

**ගරු සම ලේකම්වරු**

කෝසල එදිරිසිංහ මහතා. දු.ක : 071 632 2306
මංජුල පත්මකුමාර මහතා. දු.ක : 071 529 5855

**ගරු භාණ්ඩාගාරික**

චමින්ද ඉන්දික මහතා. දු.ක : 071 229 9212

**ගරු උප භාණ්ඩාගාරික**

සුරංග ලියනගේ මහතා. දු.ක : 077 599 4987

**ගරු සංස්කාරක**

එම්. කේ. ප්‍රියන්ත මහතා. දු.ක : 071 228 5680

**ගරු කාරක සභිකවරු**

මෙනුර ඩයස් මහතා / ජගත් ප්‍රසන්න මහතා
දර්ශන ගලප්පත්ති මහතා / මාලන් කන්දගේ මහතා
මහේනද්‍ර ජයනාත් මහතා / චේනුක ජයනාත් මහතා

**වෙබ් අඩවි සහ මාධ්‍ය කමිටුව - සභාපති**

දක්ෂිණ උදයංග මහතා

**බුදු පිළිම කමිටුව - සභාපති**

පී. ප්‍රේමදාස පෙරේරා මහතා

**කාන්තා කමිටුව - සභාපතිනිය**

රංජනී උඩුගොඩ මහත්මිය

**තරුණ කමිටුව - සභාපති**

උචිත ජයතිස්ස මහතා

**අසරණ සරණ කමිටුව - සභාපතිනිය**

එන්. එම්. දහනායක මහත්මිය

**සුව සෙත කමිටුව - සභාපති**

අතුල නානායක්කාර මහතා

**නීති උපදේශන කමිටුව - සභාපති**

චන්දන ජයතිස්ස මහතා

**දාන - ශිල - භාවනා කමිටුව - සභාපති**

පියල් චන්ද්‍රතුංග මහතා

**අධීක්ෂණ කමිටුව**

ජී. ජී. තිලකසිරි මහතා
වික්‍රම ගුණදාස මහතා

**අප ගැන වචනයක්**

**මෙත් සවිය සංසදය, නිරවුල් මනසක් ඇති, වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් වසර දහ හතරකට පෙර අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි.** වර්තමාන සාමාජික සංඛ්‍යාව 5,500 ඉක්මවා ඇත. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මේ මඟින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරනය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටන් වැනි ඒ ඒ කාලවල දී පවත්වන වැඩසටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක්, දාන - සීල - භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටුව හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ප්‍රධාන මූලස්ථානය ලෙස පවත්වා ගනිමින් "**මෙත් සවිය මෛත්‍රී සංසදය**" පසුගිය දහහතර වසර පුරා සමථ විපස්සනා භාවනාව පන් දහස් පන්සීයකට අධික පිරිසකට උගන්වා ඇති අතර, ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කර ඇත. මීට අමතරව බෞද්ධ භාවනාවේ ප්‍රයෝජනය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ පවත්වමින් දෙස් විදෙස් ජාත්‍යන්තර සම්මන්ත්‍රන වලට එම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරනු ලබන, අප දන්නා පරිදි ලංකාවේ ඇති එකම ආයතනය ද "**මෙත් සවිය**" වේ. (මින් සමහරක් අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක). තවද මිරිසවැටිය සළපතල මළුව ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීම, නාගදිප වන්දනාවේ යන බැතිමතුන්ගේ පහසුව සඳහා වසර 30 ක දිගු යුද්ධය නිම වී මාස 06 ක් යාමට පෙර නාගදිපය සහ කිළිනොච්චියේ ලුම්බිණි විහාරයේ වැසිකිළි පද්ධතීන් සාදා නිම කොට පූජා කිරීම. මහියංගන රජමහා විහාරයේ ලක්ෂයකට වැඩි පිරිසකට පිරිසිදු ජලය පානය කළ හැකි ජල පිරිපහදුවක් සාදා පූජා කිරීම. ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහල වීම සහ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවී වසර 2600 ක් ඉක්මවීම සැමරීම සඳහා අසූහාරදහසක් ධර්මස්කන්ධය සිහිවන අයුරින් ඓතිහාසික මහියංගන රජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති "**2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුදු පිළිමය**" ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම, එසේම රෝද පුටු පරිත්‍යාග කිරීම, කොළඹ ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා මහරගම අපේක්ෂා රෝහල (පිළිකා රෝහල) ඇතුලු රෝහල් ගණනාවකට අවශ්‍ය උපකරණ ලබාදීම වැනි ලොකු කුඩා සත්කාරයන් රැසක් පසුගිය වසර දහ හතර පුරා ඉටුකර ඇත.

**සියලු ලෝ සතුන්ගේ සිත්තුල මෛත්‍රිය පැතිරේවා.....!**

# සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

## 2018 ජනවාරි 01 දින දාන-සීල-භාවනා වැඩසටහන වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ දී පෙ.ව. 6.30 - ප.ව. 4.00 දක්වා

- ජනවාරි 01 වන දින පෙ.ව. 6.30 ට සිල් දීමෙන් ඇරඹෙන ඉහත අනේවාසික භාවනා වැඩසටහනට දානය සැකසීම සඳහා සහභාගි වීමට බලාපොරොත්තු වන අය කාර්යයාලය අමතන්න.
- ජනවාරි 01 වන දින පෙ.ව. 7.00 ට දානය සඳහා සිල් ගන්නා අයටත් නොගන්නා අයටත් වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයට පැමිණ ගරු අහංගම ආනන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් ආශිර්වාද ලබා ගන්න. උදෑසන තේ පැන් සංග්‍රහයක් ද පැවැත්වේ. මේ සඳහා දානය ලබා දීමට කැමැති අය වෙතොත්, කිරිබත්, සීනි සම්බල, ඉඳි ආප්ප, ආප්ප වැනි යමක් රැගෙන ආ හැක. (අත්‍යවශ්‍යය නොවේ).
- පස්වරු 5.00 ට පසු බෝධි පූජාව පැවැත්වේ.
- සිල් ගත් අය සඳහා දහවල් දානය / දාන කොටසක් භාරගත හැක.

## 2017 වසර සඳහා නොමිලයේ බෙදා හරිනු ලබන මෙත්සවිය දින දර්ශනය

2018 වසර මෙත් සවිය දින දර්ශනය 2018 ජනවාරි 01 වන ඉරුදින සිට මෙත් සවිය කාර්යාලයෙන් ලබාගත හැකිය.

## 2018 ජනවාරි 01 දින ගංගාරාමයේ හීල් දානය

වික්‍රම ගුණදාස මහතාගේ සහ දාන-සීල-භාවනා කමිටු සභාපති පියල් (714501358) මහතාගේ සංවිධානත්වයෙන් පැවැත්වෙන හීල් දානයට (20 නමකට පමණ) සහ කෙලින්ම ගංගාරාමයට පැමිණෙන අය සඳහා දානය රැගෙන එන්න. ආප්ප, ඉඳිආප්ප, කඩල, මුං ඇට, සීනි සම්බල, පොල් සම්බල, බත්, පරිප්පු, පාන්, ආදී ආහාර ද්‍රව්‍ය ඉහත මහතුන් අමතා තම දායකත්වය සැලකර සිටින්න. පොහෝ දිනයක් බැවින් මෙවර අපගේ ප්‍රධාන වැඩසටහන පැවැත්වෙනුයේ ගංගාරාමයේ නොව වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ ය.

## 2018 ජනවාරි 01 දින ජයන්ති ළමා නිවාසයට දහවල් දානය

බෞද්ධාලෝක මාවතේ සමස්ථ ලංකා බෞද්ධ මහා සම්මේලනය අසලින් වමින් ඇති කුඩා පාරෙන් ගිය විට "**ජයන්ති ළමා නිවාසය**" හමු වේ. වසර 5 ට අඩු ළමුන් 20 - 30 පමණ ඇත. හාල්, පරිප්පු, සීනි ආදී වියළි ආහාර, රසකැවිලි, ක්‍රීඩා භාණ්ඩ මෙත් සවිය කාර්යයාලයට ලබා දියහැක. ළමුන් සියල්ලටම පැපොල රෝගය සෑදී ඇති බැවින් එහි නොපැමිණීම වඩාත් සුදුසු බව පාලක මණ්ඩලය දන්වා සිටියි.

## 2018 ජනවාරි 07 පළමු ඉරු දින වැඩසටහන ධම්මගවේෂී බෞද්ධාශ්‍රමයේ දී නොපැවැත්වේ

එදිනට පුද්ගල සංවර්ධන හා නායකත්ව පුහුණු වැඩසහන් මාලාවේ අන්තිම වැඩසටහන කමිටු නිලධාරීන් / සාමජිකයින් සඳහා ශ්‍රී විජයාරාමයේ දී පෙ.ව. 8.00 - ප.ව. 2.00 දක්වා පැවැත්වේ.

## 2018 ජනවාරි 14 ඉරු දින - 38 වන භාවනා හා චිත්ත සංයම අභ්‍යාස වැඩසටහන ආරම්භය

ඉරු දිනවල ප.ව. 2.00 - 5.00 දක්වා පැවැත්වෙන ඉහත ත්‍රෛමාසින භාවනා වැඩසටහන සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2017. 12 . 31 තෙක් දික්කර ඇත.

## 2018 පෙබරවාරි 04 ඉරු දින මාසික රැස්වීම ධම්මගවේෂී බෞද්ධාශ්‍රමයේ දී නොපැවැත්වේ

නිදහස් දිනය දා කොළඹ පැවැත්වෙන උත්සව නිසා මෙදින ධම්මගවේෂී බෞද්ධාශ්‍රමයේ පැවැත්වෙන **මාසික රැස්වීම නොපැවැත්වේ.**

## 2018 මාර්තු 04 ඉරු දින සාර්ථකව ඉගෙන ගන්නා අන්දම සහ විභාග සමත්වීමේ නවීන ක්‍රමවේද පිළිබඳ වැඩමුළුව

කොළඹ විශ්ව විද්‍යාලයේ නව කලාගාරයේ දී පැවැත්වෙන ඉහත වැඩමුළුවට සාමජිකයන් හා සාමජිකයන්ගේ පවුල් වල අයට නොමිලේ සහභාගි විය හැක.

- සාමජිකයින් නොවන පාසැල් සිසුන් / වැඩිහිටියන් සඳහා බරපැන රු. 500/- කි.
- පාසැල් වල දරුවන් සඳහා ටිකට් පත් විකිණීමට අවශ්‍යනම් කාර්යාලයෙන් විමසන්න.
- සාමාජික නොවන අය පැමිණෙන්නේ නම් 2017 පෙබරවාරි 25 ට පෙර 071 401 4467 හෝ 011 2 50 50 88 කාර්යයාලය අමතා ඒ බව දන්වා ආසල වෙන්කරවා ගන්න.
- මුද්‍රිත ද්‍රව්‍ය හා තේ පැන් සැපයේ.

## 2018 අප්‍රේල් 01 ඉරු දින - වාර්ෂික මහ සභා රැස්වීම හා මෛත්‍රී භූෂණ සම්මාන උළෙල

මෙත් සවිය වාර්ෂික මහ සමුළුව හා මෛත්‍රී භූෂණ සම්මාන උළෙල ප.ව. 2.00 - 5.00 දක්වා පැවැත්වීමට නියමිත බව සියලුම සාමජික සාමාජිකාවන්ට දැනුමේදෙන අතර ඒ සඳහා දායකත්වය ලබාදීමට හැකි නම් ලේකම්වරු (කෝසල හෝ මංජුල මහතා) අමතන්න.

## මුද්දර ආධාර

මුද්දර ගාස්තු වැඩි වී ඇති බැවින් සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග කිරීම කැමති පින්වතුන් හට කැමති ප්‍රමාණයක මුද්දර කාර්යාලයට පරිත්‍යාග කරන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

## අසරණ සරණ සහ මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා පිංකැටවල එකතු කළ මුදල්

සතුන් නිදහස් කිරීම සඳහා පිං කැටවල එකතු කළ මුදල් භාරදීමට කැමති අය කාර්යාලයට එම මුදල් භාර දී පිං පත්‍රිකාවක් ලබා ගන්න.

## මීළඟ මෙත් සවිය සඟරාවේ පළ කිරීම සඳහා සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පළ කරනු ලබන දැන්වීම් භාර ගැනීම

මීළඟ මෙත් සවිය සඟරාවේ එල කිරීම සඳහා ලබාදෙන සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ එල කරනු ලබන දැන්වීම් 2018 - 02 - 28 දිනට පෙර සභාපතිතුමා වෙත හෝ කාර්යාලයට හෝ භාර දෙන්න.

## පුස්තකාලයෙන් ලබා ගත් පොත් නැවත ලබා දෙන්න

පුස්තකාලයෙන් ලබා ගත් පොත් නැවත ලබා දෙන මෙන් සියළුම සාමාජිකයින්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

## මෙත් සවිය හැඳුනුම්පත සහ සාමාජිකත්වය අළුත්කර ගැනීම

මෙත් සවිය හැඳුනුම්පත් මෙතෙක් ලබා නොගත් සාමාජිකයින් එම හැඳුනුම්පත් මෙත් සවිය කාර්යයාලයට පැමිණ ලබා ගන්න. තවද මෙත් සවිය රඳා පවතින්නේ ඔබගේ සාමාජික අරමුදල් මතය. එබැවින් සාමාජිකත්වය අළුත් කර නොගත් අය වෙත්නම් හැකි ඉක්මනින් සාමාජිකත්වය අළුත්කරගෙන අප සංසදයෙන් කෙරෙන සියළුම පුණ්‍යකටයුතු වල කොටස් කරුවකු වන්න.

## පුස්තකාලය නවීකරණය

නව පොත් සහ CD එකතුවක් සමගින් කියවීමේ පහසුකම් සහිතව නව පුත්කලය කාර්යයාලය පිහිටි ගොඩනැගිල්ලේ පළමු මහලේ ස්ථාපනය කර ඇත.

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ

# 14 වන සංවත්සර වාර්තාව

වර්ෂ 2017 ක් අප්‍රේල් මස 2 වන ඉරුදින පස්වරු 1.30 ට කොලඹ 7 බෞද්ධාලෝක මාවතේ ධර්මගවේෂී බෞද්ධාශ්‍රම ශාලාවේදී මෙත්සවිය සංසදයේ 14 වන මහ සමුළුව සහ මෛත්‍රී භූෂණ සම්මාන උළෙල උත්කර්ශවත් අයුරින් ඇරඹුණි. උත්සවයේ මුලසුන හෙබවීමට නියමිතව සිට බම්බලපිටිය ශ්‍රී වජිරාරාමාධිපති අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායේ මහා නායක රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති ත්‍රිකුණාමලයේ ආනන්ද මහානායක හිමිපාණන්ගේ ගෞරවනීය වැඩමකරවීම සිදුවිය. උත්සවයේ ප්‍රධාන අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගරු අධිකරණ සහ බුද්ධශාසන අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතා සහභාගී වීමට නියමිතව තිබුනද නොවැලැක්විය හැකි හේතුවක් නිසා එතුමන්ට සහභාගී වීමට නොහැකිවිය. විශේෂ ආරාධනාවක් මත ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගරු කුඩා කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් උත්වයට සපැමිණියේය.

ගරු අමාත්‍යතුමා සහ මෛත්‍රී භූෂණ ලාභී වෛද්‍යවරුන් ඇතුළු සම්භාවනිය ආරාධිත අමුත්තන් මෙත්සවිය සංසදයේ ගරු සභාපති නාලන්දා කීර්ති ශ්‍රී, ශාසනදීපන, විද්‍යාකීර්ති මහාචාර්ය චන්දන ජයරත්න මැතිදුන් සහ සංසදයේ ගරු සමලේකම්වරුන් විසින් බුලත් හුරුළු පිළිගන්වා සාදරයෙන් පිළිගන්නා ලදී. ඉක්බිතිව සම්භාවනීය ආරාධිත අමුත්තන් විචිත්‍රවත් පෙරහැරකින් සභාගැබ වෙත කැඳවාගෙන එන ලදී.

අනතුරුව උත්සවයේ සමාරම්භය සනිටුවන් කරමින් පොල්තෙල් පහන දැල්වීමේ අවස්ථාව උදාවිය. ගරු අමාත්‍යතුමා, මෙත්සවිය ගරු සභාපති, සම්මාන ලාභී වෛද්‍යවරුන් ඇතුළු සම්භාවනීය අමුත්තන් විසින් පොල්තෙල් පහන දැල්වීම සිදුකරන ලදි. ඉක්බිතිව පැමිණසිටි පිරිස මෙත්සවිය තේමාපාඨය තුන් වරක් ගායනා කිරීමෙන් අනතුරුව උත්සවයේ වැඩකටයුතු ආරම්භ කරන ලදි. ඉන්පසුව බම්බලපිටිය ශ්‍රී වජිරාරාමාධිපති අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායේ මහා නායක රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති ත්‍රිකුණාමලයේ ආනන්ද මහානායක හිමිපාණන් විසින් මුලසුන හෙබවමින් සභාව ආජීවක අෂ්ඨමක ශීලයේ පිහිටවන ලදි. ඉන්පසුව මෙත්සවිය සංසදයේ ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිදුන් විසින් පිළිගැනීමේ සටහන තබමින් මහා සංඝරත්නය ප්‍රමුඛ පැමිණි සිටි සම්භාවනීය අමුත්තන් ඇතුළු පැමිණි සිටි පිරිස පිළිගන්නා ලදි. මින් අනතුරුව හොරණ විදුසිළු රංගායතනයේ දරු දැරියන් විචිත්‍රවත් රංගනයක් ඉදිපත් කරන ලදි.

මින් අනතුරුව මෛත්‍රී භූෂණ සම්මාන ප්‍රධානය කිරීමේ අවස්ථාව උදාවිය. මෙත් සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ඨ සේවය හා ප්‍රවීණතාවය උදෙසා පිරිනැමෙන මෛත්‍රී භූෂණ ගෞරව සම්මානය හෘද රෝග පිලිබඳ ආයුර්වේද විශේෂඥ වෛද්‍ය සරත් සෝමසිරි ගුණවර්ධන වෙද මහතා වෙත ගරු කුඩා කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මහතාගේ සුරතින් ප්‍රධානය කිරීමට යෙදිනි. දෙවනුව මෙත් සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ඨ සේවය හා ප්‍රවීණතාවය උදෙසා පිරිනැමෙන මෛත්‍රී භූෂණ ගෞරව සම්මානය දේශීය අක්ෂිවෛද්‍ය වෛද්‍ය ශිරෝමණි ලංකාපුත්‍ර පී. වීරසිංහ වෙද මහතා වෙත ගරු ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මහතාගේ සුරතින් ප්‍රධානය කිරීමට යෙදිනි. අනතුරුව මෛත්‍රී භූෂණ සම්මානයෙන් පිදුම් ලැබූ වෛද්‍යවරුන් දෙපල මෙවැනි සම්මාන පිරිනැමීමේ වැදගත්කම පසක් කරමින් කෙටි දේශනයන් දෙකක් පවත්වන ලදි. අනතුරුව මෙත් සවියේ ගරු අනුශාසක අධිකරණ සංඝනායක අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමින්වහන්සේ විසින් සම්මාන ලාභී වෛද්‍යවරුන්ගෙන් සිදුවන සේවය පාදක කරගනිමින් අනුශාසනාවක් පවත්වන ලදි. ඉන්පසුව උත්සවයේ ප්‍රධාන අමුත්තා වූ කුඩා කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මැතිතුමන් විසින් ආයුර්වේද හා දේශීය වෙදකම් වල ඇති වටිනාකම සඳහන් කරමින් දේශනාවක් පවත්වන ලදි. මින්පසුව හොරණ විදුසිළු රංගායතනය මගින් විචිත්‍රවත් රංගනයක් ඉදිරිපත් කරන ලදි.

මෙත්සවිය සංසදයේ උන්නතිය උදෙසා තම ශ්‍රමය ධනය කාලය කැපකරමින් සුවිශේෂී වූ සේවාවන් ඉටුකරන ලද ඉංජිනේරු ප්‍රියන්ත පියදාස සහ විගණකවරුන් වන ප්‍රසංග පෙරේරා සහ කේ. ඒ. ඩී. පද්මසේන යන මහත්වරුන් මෙත්සවිය වෙනුවෙන් කරන ලද සේවාව අගයමින් විශේෂ ඇගයීමේ සම්මාන පිරිනැමීම මීලගට සිදුවිය. ස්වෙච්චාවෙන් ඉදිරිපත් වී තම සේවා කාලය තුල, තම ශ්‍රමය ධනය කාලය කැපකරමින් මෙත්සවියේ උන්නතිය වෙනුවෙන් කරන ලද සේවය ඇගයීම් පිණිස මෙත්සවිය කමිටු සාමාජිකයන් උපහාරයෙන් පිදීම මීලගට සිදුවිය.

ඉන්පසුව මුලසුන හොබවමින් වැඩවිසු බම්බලපිටිය ශ්‍රී වජිරාරාමාධිපති අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායේ මහා නායක රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති ත්‍රිකුණාමලයේ ආනන්ද මහානායක හිමිපාණන් විසින් කෙටි ධර්මදේශනයක් පවත්වන ලදි. ඉක්බිතිව මෙත්සවිය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ශිෂ්‍යත්ව ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසකට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සිදුකරන ලදි. මෙත්සවිය ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිදුන් සහ මෛත්‍රී භූෂණ සම්මාන ලාභී වෛද්‍යවරුන් විසින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සිදුකරන ලදි.

ඉන්පසුව මෙත්සවිය මාසික ධර්මදේශනාව පූජ්‍ය බොරැල්ලේ කෝවිද ස්වාමින්වහන්සේ විසින් පවත්වන ලදි. ධර්මදේශනාවෙන් අනතුරුව පැමිණි සිටි පිරිස වෙත තේ පැන් සංග්‍රහයක් පවත්වන ලදි. මින් අනතුරුව මෙත්සවිය සංවත්සරයේ සහ මෛත්‍රී භූෂණ සම්මාන උළෙලේ කටයුතු නිමාවට පත්කරන ලදි.

## මෙත්සවිය
## 14 වෙනි මහ සමුළුවේ වාර්තාව

වර්ෂ 2017 ක් වූ අප්රේල් මස 02 වන ඉරුදින පසවරු 5.00 ට කොලඹ 07 බෞද්ධාලෝක මාවතේ, ධර්මගවේෂී බෞද්ධාශ්‍රම ශාලාවේදී, සංසදයේ ගරු පැවිදි අනුශාසක අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමින්වහන්සේගේද, මෙත්සවිය නිර්මාතෘ සහ සංසදයේ ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේද ප්‍රධානත්වයෙන් ආරම්භ විය. සංසදයේ ගරු සමලේකම් චින්තක බණ්ඩාර මහතා මෙත්සවිය 14 වන සමුළුවේ සමාරම්භක සටහන තබමින් සමුළුවේ කටයුතු ආරම්භ කරන ලදි.

පළමුව 13 වන මහසමුළුවේ වාර්තාව මෙත්සවිය සංසදයේ ගරු සමලේකම් කෝසල එදිරිසිංහ මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙසට පී.පී. පෙරේරා මහතා යෝජනා කළ අතර පී. පී. තිලකසිරි මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි. ඉන්පසුව මෙත්සවිය 2016/2017 වර්ෂ තුල සිදුකෙරුණු ක්‍රියාකාරකම් පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් ගරු සමලේකම් චින්තක බණ්ඩාර මහතා විසින් සභාවට ඉදිරිපත් කළ අතර එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ජගත් ප්‍රසන්න මහතාගේ යෝජනාවෙන් හා වික්‍රම ගුණදාස මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් පිළිගනු ලැබින. අනුතුරුව මෙත්සවිය සංසදයේ ගරු උප භාණ්ඩාගාරික සුරංග ලියනගේ මහතා විසින් 2016 වර්ෂය සඳහා වූ විගණනය කරන ලද අයවැය වාර්තාව ඉදිරිපත් කිරීමට යෙදුනි. ඉදිරිපත්කල අයවැය වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ප්‍රදීප් යහම්පත් මහතාගේ යෝජනාවෙන් හා අතුල නානායක්කාර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

අනතුරුව මෙත්සවිය ව්‍යවස්ථානුකූලව මෙත්සවිය සංසදයේ සභාපති තුමා ඇතුළු නිලධාරි මණ්ඩලය දරන තනතුරු වලින් ඉල්ලා අස්විය. ඉදිරි වසර සඳහා මෙත්සවිය සංසදයේ සභාපති ලෙස මහාචාර්ය චන්දන ජයරත්න මහතා තෝරාපත්කර ගන්නා ලදි. තවද උපසභාපතිවරුන් ලෙස වෛද්‍ය චන්දිම මාරසිංහ මහතා හා චින්තක බණ්ඩාර මහතාද, සමලේකම් තනතුරු සඳහා මංජුල පද්මකුමාර මහතා සහ කෝසල එදිරිසිංහ මහතාද, භාණ්ඩාගාරික ලෙස චමින්ද ඉන්දික මහතා ද, උප භාණ්ඩාගාරික ලෙස සුරංග ලියනගේ මහතාද, සංස්කාරක ලෙස එම්. කේ. ප්‍රියන්ත මහතා ද තෝරා පත් කරගන්නා ලදි. කාරක සභික වරුන් ලෙස මෙනුර ඩයස්, දර්ශන ගලප්පත්ති, මාලන් කන්දගේ, ජගත් ප්‍රසන්න, මහේන්ද්‍ර ජයනාත්, චේනුක ජයසූරිය යන මහත්වරුන් තෝරාපත් කරගන්නා ලදි. තවද වෙබ් කමිටු සභාපති ලෙස දක්ෂිණ උදයංග මහතාද, බුදුපිළිම ක්‍රියාකාරී කමිටුවේ සභාපති ලෙස පී. පී. පෙරේරා මහතාද, කාන්තා කමිටුවේ සභාපතිනිය ලෙස රංජනී උඩුගොඩ මහත්මියද, තරුණ කමිටුවේ සභාපති ලෙස උචිත ජයතිස්ස මහතාද, අසරණ සරණ කමිටුවේ සභාපතිනිය ලෙස එන්. එම්. බී. දහනායක මහත්මියද, සුවසෙත කමිටුවේ සභාපති ලෙස අතුල නානායක්කාර මහතාද, නීති උපදෙස් කමිටුවේ සභාපති ලෙස නීතිඥ චන්දන ජයතිස්ස මහතාද, දාන සිල භාවනා කමිටුවේ සභාපති ලෙස පියල් චන්ද්‍රතුංග මහතාද තෝරාපත්කර ගන්නා ලදි.

නිලධාරි මණ්ඩලය තෝරා පත්කරගැනීමෙන් අනතුරුව මෙත්සවිය සංසදයේ සමාගම් ලේකම් ලෙස හිටපු සමාගම් ලේකම් වන රොබට් හේවගේ මහතා ද විගණනකරුවන් ලෙසට පෙරසිටි විගණනකරුවන් වන MKJ Associates (වරලත් ගණකාධිකාරිවරු) නැවතත් 2017/2018 වර්ෂය සඳහා තෝරාපත්කරගැනීමට සුරංග ලියනගේ මහතා යෝජනා කරන ලදි. අනතුරුව, අප්‍රේල් 1 සිට මාර්තු 31 ලෙස පැවති මෙත්සවිය සංසදයේ ගිණුම් වර්ෂය ජනවාරි 1 සිට දෙසැම්බර් 31 ලෙස ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට යෝජනා විය. එම යෝජනාව සභාවේ ඒකමතික තීරණයෙන් ස්ථිරවිය. අනතුරුව මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් ස්තුති කතාව කරමින් සංවත්සර උළෙල සාර්ථක කරගැනීමට උදව් කළ විවිධ පාර්ශවයන්ට විශේෂ ස්තුතිය පුද කරන ලදි. මීලග මාසික රැස්වීම අප්‍රේල් 09 වන ඉරුදින පස්වරු 1.00 ට වැල්ලවත්ත ශ්‍රී විජයාරාම විහාරස්ථානයේදී පැවැත්වීමට යෝජනා කරමින් මහ සමුළුවේ වැඩ කටයුතු නිමාවට පත් කරන ලදි.

මෙත්සවිය
සුභසාධක කමිටුව

## සාමාජිකයින්ට අතහිත දීම පිණිස මෙත් සවිය සුභසාධක කමිටුව ආරම්භ කළ වගයි...

මෙත් සවිය සාමාජිකත්වයේ සුභසාධනය වෙනුවෙන් ම කටයුතු කරන්නා වූ දැනට අඩුපාඩුවක් ව පැවති ඉහත කී කමිටුව ආරම්භ කෙරුන අතර මෙත් සවිය නිර්මාතෘවරයාගේ පූර්ණ අධීක්ෂණයෙන් හා මෙහෙයවීම මත පහත සඳහන් ප්‍රතිලාභ සාමාජිකත්වය වෙත පිරිනැමෙන බව සතුටින් දන්වා සිටිමු.

- සාමාජිකයන්ගේ පෞද්ගලික දැවෙන ජීවන ගැටලු වල දී නන් අයුරින් අතහිත දීම.
- පවුලේ අවමගුල් කටයුත්තකදී සංග්‍රහ කටයුතු සඳහා නෙස්කැෆේ යන්ත්‍රයක් සහ රු. 1000 ක් දක්වා කිරි කෝපි, වතුර ෆිල්ටර නොමිලයේ පිරිනැමීම. අනාගතයේ දී හට් එකක් ද වීදුරු පිඟන් කෝප්ප ද ලබා දීමට බලාපොරොත්තු වේ.
- අවමංගල්‍ය කටයුතු වලදී රැළි පාලම් සහ සුදු කොඩි ප්‍රදර්ශනය කරවීම.
- උත්සව අවස්ථාවලදී ජල බෝතල් සහ පිඟන් භාජන සැපයීම හා සහභාගීත්වයෙන් සහය පල කිරීම.
- දේශන, ධර්ම සාකච්ඡා සහ කොළඹ රෝහල්වල බෙහෙත් ගැනීම / ප්‍රතිකාර සඳහා දුරබැහැර සිට පැමිණෙන සාමාජිකයින් වෙත කොළඹ තාවකාලික රාත්‍රී නවාතැන් පහසුකම් සැපයීම.

**පහත සඳහන් ද්‍රව්‍ය මෙත් සවියට සපයා දී මේ සඳහා ආධාර උපකාර කිරීමට කැමති පිංවතුන් කුසල් රැස්කර ගනිත්වා!**

- නෙස්කැෆේ යන්ත්‍ර ● වතුර ෆිල්ටර (water dispenser)
- වීදුරු ● පිඟන් ● හැඳි ● පැන් වඩන කට්ටල
- සුදු කොඩි ● පාලම් කොඩි ● කොඩි කණු ආදිය සහ
- ඇඳන්, කොට්ට, මෙට්ට...

**සියලු විමසීම් සඳහා පහත සඳහන් දුරකථන අංක අමතන්න...**

මෙත් සවිය : 071 40 144 67 / 011 2 50 5088

සභාපති : ධර්මසිංහ වික්‍රමආරච්චි මහතා - 071 14 94 031

ලේකම් : එන්. ජයවීර මහතා - 072 27 20 429

**තංච කම්මං කතං සාධු - යං කත්වා නානු තප්පති**
**යස්ස පතීතෝ සුමනෝ - විපාකං පටි සේවති**

''යම් ක්‍රියාවක් කිරීමෙන් අනතුරුව පසු තැවිලි වන්නට සිදු නොවන ප්‍රීතිමත්ව සොම්නස් සිත් යුතුව විපාක විඳින්නට සිදුවන ක්‍රියාවන් කිරීමට මැනවි...'' ධම්ම පදය



# ඓතිහාසික මහියංගන රාජමහා විහාර පුදබිමෙහි
# අඩි 84 ක් උසැති සම්බුද්ධත්ව ජයන්ති බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙළීම සඳහා
# 2017. 03. 01 සිට 2017. 09. 17 දක්වා ආධාර කළ පිංවතුන්ගේ නාම ලේඛනය

**(ගිණුම් අංකය : 000560001118 - සම්පත් බැංකුව - කිරිබත්ගොඩ ශාඛාව)**

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| 14/A-24036 | ප්‍රසාද් අබේසිංහ මයා | | 100 |
| 14/A-17176 | පරිත්‍යාග | | 100 |
| 14/A-26357 | චන්ද්‍ර ගුණසිරි | | 100 |
| 14/A-26358 | චන්ද්‍රිකා මිය | | 100 |
| 14/A-26359 | එච්.ඩබ්.රත්නතිලක | | 100 |
| 14/A-26356 | එල්.ඩී.සිරියලතා මිය | | 100 |
| 14/A-26355 | ප්‍රදීප් මහතා මහියංගනය | | 100 |
| 14/A-26351-26354 | නිහාල් මෙන්ඩිස් මයා | 03-0686 | 400 |
| 14/A-1047-1050 | මෙත්සවිය කමිටු සාමාජිකයන් බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 400 |
| 14/A-17597-17600 | මෙත්සවිය කමිටු සාමාජිකයන් බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 400 |
| 14/A-17997-18000 | මෙත්සවිය කමිටු සාමාජිකයන් බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 400 |
| 14/C-0728/0729 | පි.එම්.සේනාධීර මයා | 11-2014 | 500 |
| 14/C-0351 | සංජීව අමරසිංහ මයා | | 500 |
| 14/C-0352 | ගීත්මිනි ද සිල්වා මිය | | 500 |
| 14/C-0353 | කාංචනා ජයලත් මිය | | 500 |
| 14/C-0354 | කසුන් අමරසිංහ මයා | | 500 |
| 14/C-0492 | පියලතා පෙරේරා මිය | | 500 |
| 14/C-0493 | චන්දිමා පෙරේරා මිය | | 500 |
| 14/C-0355 | උපාලි චන්ද්‍රසිරි මයා | 32-5740 | 500 |
| 14/C-0734 | ඉන්ද්‍ර මාලනි පෙරේරා මිය | 1-229 | 500 |
| 14/A-21394-21400 | මෙත්සවිය කමිටු සාමාජිකයන් බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 700 |
| 14/A-26976-26982 | මෙත්සවිය කමිටු සාමාජිකයන් බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 700 |
| 14/A-24701-24707 | කේ.ආර්.විතාරණ මයා | 35-5500 | 700 |
| KETA-0586 | සර්වෝදය සාමජිකයන් | | 700 |
| 14/A-16918-16925 | මෙත්සවිය කමිටු සාමාජිකයන් බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 800 |
| 14/A-24726-24733 | කේ.ආර්.විතාරණ මයා | 35-5500 | 800 |
| 14/C-0302 | චාන්දනී පෙරේරා මිය | | 1,000 |
| 14/D-0305 | ඕ.ජී.ඩී.බණ්ඩාර මයා | | 1,000 |
| 14/D-0303 | පි.එම්.සේනාධීර මයා | 11-2014 | 1,000 |
| 14/D-0304 | ට්.එච්.සි.ද. සොයිසා අබේසේකර මයා | | 1,000 |
| 14/D-0334 | නිර්මන් පෙරේරා මයා | 35-5354 | 1,000 |
| 14/D-0335 | කෞෂිකා ප්‍රනාන්දු මිය | 35-5353 | 1,000 |
| 14/C-0490-0491 | මෙත්සවිය කමිටු සාමාජිකයන් බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 1,000 |
| 14/D-0306 | ඕ.ජී.ඩී.බණ්ඩාර මයා | | 1,000 |
| 14/D-0308 | එම්.එල්.නිල්මිණී මිය | 36-5550 | 1,000 |
| 14/D-0309 | කේ.ජී.ශෂිකලා කුමාරි මිය | 36-5599 | 1,000 |
| 14/D-0307 | සෝමා දීගල්ල මිය | 27-4211 | 1,000 |
| 14/D-0311 | රන්ජිත් ප්‍රසන්න මයා | | 1,000 |
| 14/D-0312 | එස්.ජී.මදුරංග මයා | 34-5319 | 1,000 |
| 14/D-0315 | සුරේකා නවගමුව මිය | | 1,000 |
| 14/D-0320 | ඩී.අයි.වෙත්තසිංහ මිය | | 1,000 |
| 14/D-0730 | අයි.ජී.ඉඹුලාන | | 1,000 |
| 14/D-0731 | සුරංග ලියනගේ මයා | 27-4123 | 1,000 |
| 14/D-0310 | මැසිඩා සේනාරත්න මිය | | 1,000 |
| 14/A-24751-24760 | කේ.ආර්.විතාරණ මයා | 35-5500 | 1,000 |
| 14/D-0343 | ජේ.ජී.විමලාවතී මිය | | 1,000 |
| 14/D-0344 | සුමිත්‍රා හේමකාන්ති මිය | | 1,000 |
| 14/D-063 | චාමුක කවුදාවත්ත මයා | | 1,000 |
| 14/D-064 | රත්නමාලි ජයසිංහ මිය | 23-3539 | 1,000 |
| 14/A-21376-21393 | එච්.එස්.නාලනී මිය | 17-2868 | 1,800 |
| 14/A-26951-26970 | මෙත්සවිය කමිටු සාමාජිකයන් බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 2,000 |
| 14/D-0313-0314 | ගීතා ද සොයිසා මිය | | 2,000 |
| 14/D-0316-0317 | එරන්ද ලක්ෂිත ප්‍රනාන්දු මයා | | 2,000 |
| 14/D-0318-0319 | දිලූක්ෂි මධුෂි මිය | | 2,000 |
| 14/D-0732-0733 | ඩී.අයි.වෙත්තසිංහ මිය | | 2,000 |
| KETA-0584 | චන්දන ද සිල්වා මයා | | 2,000 |

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| KETA-0585 | නයන්තා අමරසිංහ මිය | | 2,000 |
| 14/D-061-062 | අයි.එම්.සිරිවර්ධනන මයා | 01-136 | 2,000 |
| 14/D-0341-342 | ඉන්ද්‍ර මාලනි පෙරේරා මිය | 1-229 | 2,000 |
| 14/A-25351-25375 | එච්.ඩී.එච්.කාරියවසම් මිය | | 2,500 |
| 14/A-25776-25800 | මාලනි ජයවික්‍රම මිය | 36-5636 | 2,500 |
| 14/A-25951-25975 | එස්.කේ.ජී.සිල්වා මිය | 36-5577 | 2,500 |
| 14/A-26101-26125 | ජී.ජී.ගුණරත්න මයා | 05-1004 | 2,500 |
| 14/A-25726-25750 | නිර්මලී කුමාරි මිය | 20-3297 | 2,500 |
| 14/A-26151-16175 | ජී.එම්.එස්.එල්.කරුණාරත්න | 36-5621 | 2,500 |
| 14/A-26401-26425 | හේමන්ති පෙරේරා මිය | 30-4613 | 2,500 |
| 14/A-26651-26675 | රෝහිනී විජේසිංහ මිය | 35-5421 | 2,500 |
| 14/A-26376-26399 | මෙත්සවිය කමිටු සාමාජිකයන් බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 2,500 |
| 14/A-27101-27125 | මෙත්සවිය කමිටු සාමාජිකයන් බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 2,500 |
| 14/A-25901-25925 | ඉන්ද්‍ර යසන්ති පෙරේරා මිය | 35-5444 | 2,500 |
| 14/A-26201-26225 | රුවන් එගොඩගේ මයා | 36-5568 | 2,500 |
| 14/A-27076-27100 | රෝහිණී විජේසිංහ මිය | 35-5421 | 2,500 |
| 14/A-19301-19325 | ආනන්ද තෙන්නකෝන් මයා | 33-5171 | 2,500 |
| 14/A-26226-26250 | මොනිකා දමයන්ති මිය | 35-5398 | 2,500 |
| 14/A-26526-26550 | පි.ජී.ජී.පෙරේරා | 36-5626 | 2,500 |
| 14/A-27126-27150 | දිස්නා සමරසිංහ මිය | 35-5347 | 2,500 |
| 14/A-26326-26350 | වජිර ජයරත්න මයා | 15-2618 | 2,500 |
| 14/A-25751-25775 | එස්.ජී.ජයසිංහ මිය | 36-5572 | 2,500 |
| 14/A-13626-13650 | රන්ජිත් විට්ටච්චි මයා | 28-4349 | 2,500 |
| 14/A-25401-25425 | දර්ශනී පතිරණ මිය | 35-5425 | 2,500 |
| 14/A-24226-24250 | මුදිතා කුමාරි මිය | 35-5386 | 2,500 |
| 14/A-20226-20250 | ජී,ජී,ජී,පි.ජයවර්ධන මිය | 31-4818 | 2,500 |
| 14/A-25851-25875 | පි.එල්.සෙලින් මිය | 36-5536 | 2,500 |
| KETA-0616 | එන්.එම්.තුෂාරි සාගරිකා මිය | 32-5119 | 2,500 |
| 14/A-28126-28150 | ඩයනීතා අමරසිංහ මිය | 37-5752 | 2,500 |
| KETA-0587 | ඩී.ජී.අමරසිරි ද සිල්වා මයා | 32-4913 | 2,500 |
| 14/A-26076-26100 | ජේ.එස්.කන්දගේ මිය | 36-5596 | 2,500 |
| 14/A-16626-16650 | උපුල් සිරිවර්ධන මයා | 31-4869 | 2,500 |
| 14/A-19126-19150 | දර්ශනී ද සිල්වා මිය | 33-5118 | 2,500 |
| 14/A-15751-15775 | ප්‍රියානි ධර්මවර්ධන මිය | 32-4927 | 2,500 |
| 14/A-17101-17125 | හර්ෂ සම්පත් පෙරේරා මයා | 32-4898 | 2,500 |
| 14/A-27551-27575 | ගංගා පෙරේරා මිය | 11-1947 | 2,500 |
| KETA-0581 | මෙත්සවිය කමිටු සාමාජිකයන් බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 2,572 |
| KETA-0549 | සුමනා ප්‍රේමරත්න මිය | 20-3258 | 2,610 |
| KETA-0579 | කේ.ඩී.ජී.නිරෝෂා මිය | | 3,000 |
| 14/D-0331-0333 | නිහාල් මෙන්ඩිස් මයා | 03-0686 | 3,000 |
| 549 | සංජීවනී ප්‍රේමරත්න මිය | 22-3489 | 4,000 |
| KETA-0617 | සංජීවනී ප්‍රේමරත්න මිය | 22-3489 | 4,000 |
| 14/E-0113 | වාසනා අහුබුදු මිය සහ මනෝ අහුබුදු මයා | 36-5531 06-1066 | 5,000 |
| KETA-0580 | කේ.ඩී.සී.හෙට්ටිආරච්චි මිය | 25-5357 | 5,000 |
| 14/D-0336-0340 | ඉන්ද්‍රා මාලනි පෙරේරා මිය | 01-229 | 5,000 |
| 14/E-0304 | ප්‍රියංගිකා සිල්වා මිය | | 5,000 |
| 14/A-26426-26475 | මෙත්සවිය කමිටු සාමාජිකයන් බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 5,000 |
| 14/E-0115 | අනුර උදයකුමාර | | 5,000 |
| 14/E-0116 | චන්ද්‍රමාලා ගුණසේකර මිය | 32-4942 | 5,000 |
| 14/E-101 | එම්.එම්.සිරිසේන මයා | | 5,000 |
| 14/E-0116 | චන්ද්‍ර මාලා ගුණසේකර මිය | 32-4942 | 5,000 |
| 14/A-16001-160050 | මාධවී හේරත් මිය | 32-5006 | 5,000 |
| KETA-0582 | මෙත්සවිය කමිටු සාමාජිකයන් බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 5,259 |
| රු. 250 ටිකට් 24 | මෙත්සවිය කමිටු සාමාජිකයන් මහියංගන රාජ මහා විහාරයේදී | | 6,000 |
| 14/A-27376-27450 | මෙත්සවිය කමිටු සාමාජිකයන් බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 7,500 |
| 14/F-0015 | පද්මා සුමිත්‍රාආරච්චි මිය | | 10,000 |

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| 14/D-0321-0330 | කල්යානි සිල්වා මිය | 35-5441 | 10,000 |
| 14/F-0116 | චන්ද්‍රලතා නානායක්කාර මිය | 34-5232 | 10,000 |
| 14/F-26 | එච්.ටී.ආර්.පෙරේරාමයා | | 10,000 |
| KETA-0588 | මෙත්සවිය කමිටු සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 11,260 |
| 14/A-6101-6225 | වෛද්‍ය රුක්ෂනා මිය | | 12,500 |
| 551 | චන්ද්‍ර ඩයස් මිය | | 15,000 |
| 550 | මෙත්සවිය කාන්තා කමිටු සාමාජිකාවන් | | 20,170 |
| මාර්තු 2017 | ප්‍රදීප් මයා මහියංගනය | | 23,550 |
| 14/I-0013 | තිලකා ප්‍රියධර්ශනී දිසානායක මිය | 32-4750 | 25,000 |
| 14/I-014 | චින්තක හේවගේ මයා | | 25,000 |
| 14/A-26676-26950 | මෙත්සවිය කමිටු සාමාජිකයන් | | |
| | බෞද්ධාලෝක වෙසක් කලාපයේදී | | 27,500 |
| 14/ G-0063 | මහේන්ද්‍ර ජයනාත් බ්‍රිටෝ මයා සහ | 34-5221 | |
| | දිල්හානි ගුණවර්ධන මිය | 34-5220 | 100,000 |
| 14/ G-0064 | දුමින්ද දොන් විතානගේ මයා, | | |
| | ධම්මිකා නන්දනී මිය | 29-4463 | |
| | භාගයා මදුවන්ති මෙනවිය | 35-5416 | 100,000 |
| 14/ G-0065 | ලලන්ති චමලි ද සොයිසා මිය, | | |
| | සිරිදේව සූරවීර මයා | | |
| | ශලනි සූරවීර මෙනවිය | 30-4625 | 100,000 |
| 14/ G-0066 | හෙන්රීටා මිය, ගාමිණී මයා සහ | | |
| | රොෂාන් මයා | | 100,000 |
| 14/ G-0067 | විශ්වනාත් අපොන්සෝ මයා | | 100,000 |
| 14/ G-0068 | ඩී.ජේ.පියූෂාන් මයා | 19-3081 | 100,000 |
| 14/ G-0069 | චරණ බණ්ඩා මයා සහ | 36-5628 | |
| | ධනූෂා ලක්මාලි මිය | 35-5518 | 100,000 |
| 14/ G-0070 | පත්මා පුංචිහේවා මිය | 22-2291 | 100,000 |
| 14/ G-0071 | රම්‍යා දීපිකා සිල්වා මිය | 33-5094 | 100,000 |
| 14/ G-0072 | අනුලා විජේසූරිය මිය, ශෂිකලා මිය | 36-5596 | |
| | සහ සමන්ත මයා | 36-5595 | 100,000 |
| 14/ G-0051 | දුවිත්‍රී පෙරේරා මිය | | 100,000 |
| 14/ G-0074 | ලක්ෂ්මි දමයන්ති පෙරේරා මිය | 36-5352 | 100,000 |

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| 14/ G-0073 | ඩී.කේ.එම්.ජයවර්ධන මිය | | 100,000 |
| 14/ G-0075 | ලක්මාල් අබේචන්ද්‍ර මයා සහ | 34-5294 | |
| | වත්සලා රත්නායක මිය | 34-5295 | 100,000 |
| 14/ G-0076 | මෙත්සවිය සාමාජික නැසීගිය | | |
| | ලිලාන් සුරංග මහතාට පින් පිණිස | | |
| | දෙමාපියන් | | 100,000 |
| 14/ G-0077 | පත්මා පුංචිහේවා මිය | 22-3491 | 100,000 |
| 14/ G-0052 | ප්‍රියංගිකා මුදන්නායක මිය | 36-5632 | 100,000 |
| 14/ G-0078 | එම්.එන්.එස්.සිල්වා මිය | 28-4278 | 100,000 |
| 14/ G-0079 | එල්.කේ.රෝහිණී විජේසිංහ මිය | 35-5421 | 100,000 |
| 14/ G-0084 | ප්‍රදීප් යහම්පත් මයා | | |
| | (Sphere Achedamy & Mgt Consultants (Pvt) Ltd | 15-2636 | 100,000 |
| 14/ G-0080 | එච්.ඩී.පී.සේනානායක මිය | 37-5640 | 100,000 |
| 14/ G-0053 | එල්.ඩී.නිලානි මිය සහ | | |
| | ජනිත පියනදුන් මයා | | 100,000 |
| 14/ G-0081 | ජේ.කරදවල මයා | 12-2225 | 100,000 |
| 14/ G-0082 | එම්.ඩී.නන්දසිරි මයා සහ | | |
| | එම්.ඩී.එල්.කාන්ති මිය | 37-5703 | 100,000 |
| 14/ G-0083 | සී.ටී.ජිනදාස මයා | | 100,000 |
| 14/ G-0085 | ජී.ඒ.ගුණපාල මයා සහ | 37-5670 | |
| | ලලිතා රත්නායක මිය | 37-5671 | 100,000 |
| 14/ G-0086 | සොනාල් ෂෙනුක හෙට්ටිආරච්චි මයා | | 100,000 |
| 16/ J-020 | මුදිතා වික්‍රමසිංහ මිය සහ | 33-5167 | |
| | පියල් චන්ද්‍රතුංග මයා | 33-5168 | 101,000 |
| 16/ J-018 | ඩබ්.පී.දේවිකා මිය | | 101,100 |
| 16/ J-015 | වගීෂ රාජපක්ෂ මයා | | 106,000 |
| 16/ J-016 | චනිත්‍රී කාංචනා මිය, ෂෝන් කවිෂ් | | |
| | පුතා සහ චන්දිම කහදවල මයා | | 125,000 |
| 16/ J-019 | ලක්ෂ්මි කොඩිතුවක්කු මිය | | 130,000 |
| රු.100 ටිකට් 2360 | මෙත්සවිය කමිටු සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 236,000 |
| 16/ J-017 | ජී.එන්.කරුණාරත්න මයා | | 250,000 |

## මෙත් සවිය අසරණ සරණ කමිටුව

**2017 වර්ෂයට අදාල අසරණ සරණ කමිටුවේ ක්‍රියාකාරී කටයුතු සහ අසරණ සරණ තක්ෂිලාවේ සරසවි වරම් ලද දූපුතුනටත්, පාසැල් යන හා අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන්ටත් ප්‍රදානිත ශිෂ්‍යත්ව.**

### ක්‍රියාකාරී කටයුතු:

- ★ 2017 අප්‍රියෙල් 02 වැනි දින පවත්වන ලද 14 වැනි සංවත්සර උළෙලෙදී ශිෂ්‍යත්වලාභීන් 30 කට ආසන්න පිරිසක් කැඳවන ලදි. එහිදී ඔවුහු වෙනුවෙන් පහත සඳහන් දෑය ප්‍රදානය කරන ලදී.
- ★ පැමිණි සෑම ශිෂ්‍යත්ව ලාභියකු සඳහා පොත් බෑගයක් ප්‍රදානය කරන ලදී.
- ★ වෛද්‍ය පීඨ සිසුවියක් සඳහා වෙදනලාවක් (Telescope) ලබා දුනි.
- ★ ශිෂ්‍යත්වලාභී දියණියක් අ. පො. ස. සා. පෙළ) විශිෂ්ඨ සාමාර්ථ 09 ක් ලබා සිය හෘදයංගම කෘතවේදී ස්තුති කථාවක් සභාව අමතා කරන ලදී. එහිදී අප ආචාර්ය චන්දන මැතිඳුන්ගේ මැතිනිය විසින් මලලසේකර ශබ්දකෝශයක් පරිත්‍යාග කරන ලදී.
- ★ පැමිණ සිටි සියළුම ශිෂ්‍යත්වලාභීන් සඳහා ගමන් වියදම් සහ කෑමබීම සපයන ලදී.
- ★ 14 වැනි සංවත්සරය වෙනුවෙන් බෞද්ධයා රූපවාහිනී නාලිකාවේ ප්‍රචාරය සඳහා ධර්මදේශනාව දේශනා කරනු ලැබුවේ පූජ්‍ය බොරැල්ලේ කෝවිද ස්වාමීන්වහන්සේ විසිනි. ඒ සඳහා මෙත් සිතින් දායකත්වය ඉසුලූයේ මෙත්සවිය සභාපතිතුමානන් වන චන්දන ජයරත්න මැතිඳුන් සහ අප අසරණ සරණ කමිටුවේ සාමාජිකාවක වන නිලංගනී මිය සහ එතුමියගේ පුත් මෙත්සවිය සාමාජික යසිත් ඉමංග සහ ඉසංග රත්නායක යන මහත්ම මහත්මීන් විසිනි.
- ★ 2017 මැයි මස ඇති වූ ගංවතුර ආපදා අවස්ථාවේ අසරණ සරණ කමිටු සාමාජිකා නිලංගනී මිය සහ එතුමියගේ පුත් යසිත් ඉමංග මයා ගේ ඉදිරිපත්වීමෙන් රු. 77,000/- ක පමණ පාරිභෝගික භාන්ඩ සහ ඇඳුම් මිලදී ගැනිමට මංජුල මහතාගේ ප්‍රධානත්වයෙන් ආකේෂ් මයා, නිලංගනී මිය සහ කමිටු සභාපතිනි දහනායක මිය යන අය සහබාගි විය. එමෙන්ම ඇඳුම් පැලඳුම් වයස් කාණ්ඩ අනුව ඇසුරුම් කිරීමද සිදුකරන ලදී. ඒ සඳහා දායකත්වය සහ සහබාගිත්වය ලබාදීම වෙනුවෙන් මෙත්සිතින් පුණ්‍යානු මෝදනා කරමු.
- ★ 2014 වර්ෂයේ සිට ශිෂ්‍යත්ව ලාභීන් සඳහා පරිහරනය වූ ලිපිගොනු කවර මේ වන විට අබලන්ව තිබූ බැවින් නිලන්ත මහතාගේ රු. 5000/- සහ අප සාමාජික සාමාජිකාවන්ගේ ස්වේච්ඡා දායකත්වයෙන් දිගුකාලිනව පරිහරනය කලහැකි ලිපිගොනු කවර 50ක් (තොග මිල එකක් රු, 140/-) මිලදී ගන්නා ලදී. ක්‍රියාකාරී සියළුම ලිපි ගොනු කාණ්ඩ තුනකට වෙන්කර (සිසු, දානපති, ගිණුම්) නව ෆයිල් වලට අනුගතකර, ඉතාමත් පහසුවෙන් ලිපි ගොනුවක් ලබා ගත හැකි අයුරින් පිළියෙල කරන ලදී ඒ සඳහා කමිටු සාමාජිකයින්ගේ නොමසුරු ශ්‍රම දායකත්වය ලද බව සතුටින් ප්‍රකාශකර සිටිමු.

★ 2017 මැයි මස අවසන් ඉරු දින මෙත් සවිය භාවනා වැඩසටහනට සහභාගි වූ පිංවතුන් සඳහා තේ පැන් සංග්‍රය අප කමිටු දායකත්වයෙන් සිදු විය.

★ 2017 අගෝස්තු මස පෝය වැඩසටහනේ ගිලන්පස දානය සඳහා දානමය ද්‍රව්‍ය සහ ශ්‍රම දායකත්වය ලබාදුනි.

★ 37 වන නව සාමාජික කණ්ඩායම බඳවා ගන්නා දින ඔවුන් අපහසුතාවයට පත්වීම වැලකීම සඳහා ප්‍රධාන කමිටුවෙන් කවුන්ටර් සේවයක් පටන් ගැනුණි. එම සේවාව සඳහා අසරණ සරණ කමිටු සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වය ලබා දෙන ලදී.

★ 2017 සැප්තැම්බර් මස 09 දින පැවති දානමය පිංකම සඳහා අප සාමාජිකයින්ගේ සහභාගීත්වය ඉහලින් ලබා දුනි.

★ 2017 සැප්තැම්බර් මස 17 දින පැවති අක්ෂි සායනයට අවශ්‍ය පරීක්ෂණ කටයුතු සඳහා සහ සායනයට පැමිණි අයට ලබා දුන් තේ පැන් සංග්‍රහ සඳහා මුදලින් කොටසකට දායකත්වය ලබාදුනි.

★ 2017 සැප්තැම්බර් මස 23 දින පැවති ශ්‍රමදානය සඳහා නිලංගනී මිය,දයානන්ද මයා ඇතුළු මහත්ම මහත්මීන් කිහිපදෙනෙකුගේ ශ්‍රම දායකත්වය ලබාදුනි.

★ අසරණ සරණ කමිටුවට සහ පුස්තකාලයට අත්‍යවශ්‍යව තිබූ මේස දෙකක් අශෝකා හේමමාලි ජයතිලක මහත්මියගේ රු. 8500/ පරිත්‍යාගයෙන් ලබා දෙන ලදී.

★ අප කමිටුවේ සාමාජිකයන්ගේ සංඛ්‍යාව වැඩිවීම නිසා මෙත්සවිය ක්‍රියාකාරී කටයුතු වලදී වැඩි ශ්‍රමදායකත්වයක් ලබාදීමට හැකිවී තිබේ.

★ අසරණ සරණ කැට ප්‍රවර්ධන ක්‍රියාදාමයක් ආරම්භ කර ඇත.ඉරිදා දිනයේදී ලැබෙන කැට එදිනම ගනනයකර රිසිට් පතක් ලබා දීම සහ මුදල් (කාසි) වෙන්කර පරිපාලන නිලධාරිතුමාට බාරදීම සිදුකෙරෙනු ලැබේ.

★ දානපතීන් සහ ශිෂ්‍යත්වලාභින්ගේ සංඛ්‍යාව වැඩිවී ඇත.

## - ශිෂ්‍යත්ව පරිපාලන කටයුතු -

* ශිෂ්‍යත්ව අයදුම්පතක් ලද පසු එය පරීක්ෂාකර, ශිෂ්‍යත්වය ඉදිරිපත්කර ඇති පාර්ශවයන්ගේ (ස්වාමීන්වහන්සේ, මෙත් සවිය සාමාජික, සඟරාව මගින්) තහවුරුව මගින් සෑහීමට පත්විය හැකි නම්, එම අයදුම්පත් අනුමැතිය සඳහා ආචාර්යතුමාට යොමුකරනු ලබයි.

* ශිෂ්‍යත්ව ප්‍රදානකල පසු ඔවුන්ගේ ප්‍රගතිවාර්තා සහ වියදම් වාර්තා ලබා ගැනීමට අවශ්‍ය ආකෘති පත්‍ර යවා ලිපි මගින් ඔවුන් දැනුවත් කෙරෙති. නියමිත කාලයට ප්‍රගති වාර්තා නොලැබේ නම් සිහිකැඳවීම් ලිපි මගින් ඔවුන් දැනුවත් කර ඒවා ලබාගන්නා අතර දිගුකාලිනව ප්‍රගති වාර්තා නොඑවන්නේ නම් ශිෂ්‍යත්වය තාවකාලිව නතර කරනු ලැබේ.

* ප්‍රගති වාර්තා ලද පසු ඒවායේ ඡායා පිටපත් අදාල ශිෂ්‍යත්ව ප්‍රදානිතයාට යවනු ලැබේ.

* දානපතියන් ගෙන් මාසිකව හෝ ත්‍රෛමාසිකව හෝ වාර්ෂිකව ශිෂ්‍යත්ව වාරික මුදල් ලබාගැනීමට කටයුතු කරන අතර ප්‍රමාදදෝෂයකින් හෝ කලට වේලාවට මුදල් නොලැබේ නම් ඔවුනට සිහිකැඳවීම් කරනු ලැබේ.ශිෂ්‍යත්වය අයදුම් කිරීමේදී වැරදි, අසත්‍ය තොරතුරු සැපවුවහොත් ශිෂ්‍යත්වය අවලංගුවේ. අධ්‍යාපනයට නොවන වියදම් දැරීමෙන්ද ශිෂ්‍යත්වය අවලංගු වේ.

## - ගිණුම් කටයුතු -

ආචාර්යතුමන්ගේ අනුමැතියෙන් යුතු,ප්‍රගති වාර්තා කලට වේලාවට ලැබී ඇති,ශිෂ්‍යත්ව සඳහා නාමලේඛනය සකසා මුදල් යැවීම සඳහා බැංකු වවුචරපත් (50ටආසන්න) සම්පූර්ණ කර නාමලේඛනය සමග තුලනය කර, පරිපාලන නිලධාරි තුමාට බාර දෙනු ලැබේ.

මුදල් බැංකු ගතකළ පසු වවුචර පිටපත් අදාල සිසුන්ගේ ලිපිගොනු වලට ඇතුලත් කරන අතර මේ සඳහා පවත්වාගෙන යනු ලබන ලෙජරයට ද සටහන් කෙරේ.ලෙජරයට සමගාමීව සිසුවාගේ ලිපි ගොනුවද තුලනය විය යුතුවේ.

පොරොන්දු වූ කාල සීමාව අවසන් වූ දානපතියන් වෙනුවට නව දානපතියන් අනුයුක්ත කල යුතු වේ. සෙනසුරාදා දිනයන්හි ගිනුම් කටයුතු සිදුකරලීමට සිය කාලය ශ්‍රමය ධනය වැයකර පැමිණෙන සාමාජිකයිනට ආශිර්වාදාත්මක ප්‍රනාමය හිමිවේ.

## - පරිගණක කටයුතු -

පසු ගිය මාස දෙකක පමණ කාලය තුලදී 2014 සිට 2017 වසර දක්වා ප්‍රදානය කරන ලද ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යත්වලාභීන් පිළිබඳවත්, ශිෂ්‍යත්ව ප්‍රදානිතයන් ගැනත් තොරතුරු පරිඝනක ගත කර ඇත. ලිපි ගොනු පරීක්ෂාවකින් තොරව අවශ්‍ය තොරතුරු මෙ මගින් ලබා ගත හැක.

ශිෂ්‍යත්ව ප්‍රදානිතයන්ගේ නොපියවුම්, සිසුන් ගේ ප්‍රගති වාර්තා නො ලැබීම්, මාසිකව ශිෂ්‍යත්ව මුදල් ලැබීම්, සතුන් නිදහස් කිරීමට ඇති ලැබීම්, කැට වලින් ලැබීම් පිළිබඳ මාසික වාර්තා පරිඝනකය හරහා ලබා ගත හැක.

මෙත් සිත් පෙරදැරිව ආචාර්යතුමන් කරන සත් කාර්යන් අතරින් අසරනයන්ට පිහිටවීමේ කාර්යභාරයේ දී අප සාමාජික මහත්ම මහත්මීන්ට ලද මෙම මහගු අවස්ථාව ප්‍රයෝජනයට ගෙන ධර්ම මාර්ගයට අවතීර්න වීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවා.!

අසරණ සරණ කමිටු සභාපතිනී.
**එන්.දහනායක මිය.**



## දින දර්ශනය මුද්‍රණය කිරීම

මෙත් සවිය මගින් ප්‍රකාශයට පත් කරන **"මෙත් සවිය දින දර්ශනය"** 2018 වසර සඳහා මුද්‍රණය වෙනුවෙන් අනුග්‍රහය ලබාදුන් කොළඹ 03, ධර්මපාල මාවතේ අංක 78 හි පිහිටි **"මොන්ඩි"** ආයතනයට සහ දේවිකා විජේවීර මහත්මියට මෙත් සිතින් ආශිර්වාද කරමු.




## සඟරාව මුද්‍රණය කිරීම

මෙත් සවිය මගින් ප්‍රකාශයට පත් කරන **"මෙත් සවිය සඟරාව"** මුද්‍රණය කිරීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන අතර, **ඒ සඳහා පිංවත් ඔබටත් බරපැන දායක්වය දැරීමට හැකියාව ඇත.**

වැඩි විස්තර සඳහා කාර්යාලය අමතන්න.



## මෙත් සවිය ටී ෂර්ට්

**මෙත් සවිය නාමය සහිත, සුදු පැහැති ටී ෂර්ට් එක රු. 1000/- ක් දී** මෙත්සවිය කාර්යාලයෙන් ලබා ගත හැක. මින් ලැබෙන ප්‍රතිලාභ සියල්ල **බුදු පිළිම තැනීම සඳහා සහ පුණ්‍ය කටයුතු සඳහා වැයකරනු ලැබේ.**



# බුදුපිළිම කමිටුව

**2017 ජූලි 23 වන දින සිට බුදු පිළිම ක්‍රියාකාරී කමිටුව පහත නිළධාරී මණ්ඩලයකින් පුළුල් විය.**

- **පී. පී. පෙරේරා මහතා**
  විධායක හා ප්‍රචාරක කමිටුව - සභාපති
- **ඩී. සී. ඒ. එස්. පද්මතිලක මහතා**
  තාක්ෂණ හා ගොඩනැගීමේ කමිටුව - සභාපති
- **සුපුන් ඒකනායක මහතා**
  මූල්‍ය හා ගිණුම් කටයුතු කමිටුව - සභාපති
- **ඉසංගික උදිත මහතා**
  උත්තර පූර්ව ලංකාද්වීප කමිටුව - සභාපති
- **මහේන්ද්‍ර ජයනාත් බ්‍රිටෝ මහතා**
  අපර ලංකා කමිටුව (බස්නාහිර) - සභාපති
- **එච්. ටී. සමන් උදයසිරි මහතා**
  දක්ෂිණ ලංකා කමිටුව - සභාපති
- මධ්‍යම ලංකා කමිටුව
- **නිශා රණසිංහ මහතා**
  විදේශ සම්බන්ධතා කමිටුව - සභාපති
- **ඒ. එන්. පී. මෙන්ඩිස් මහතා**
  පූජා හා විවිධ සේවා කමිටුව - සභාපති

**- මෑත කාලීන ක්‍රියාකාරකම් -**

මහියංගනය රාජමහා විහාරයේ ඇසළ පෙරහැර පැවති දිනවල එනම් සැප්තැම්බර් මස 2, 3, 5 යන දිනයන් හි බුදු පිළිමය සඳහා අරමුදල් රැස්කිරීමටත් එහි පැමිණෙන පිරිස් මේ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලදී.

**- බුදු පිළිම වහන්සේ ඉදිකිරීමේ වර්තමාන තත්වය -**

මහියංගනය රාජමහා විහාරයේ විහාරාධිපති ගරු උරුළෑවත්තේ ධම්ම රක්ඛිත ස්වාමින්ද්‍රයන් වහන්සේගේ උපදෙස් මත නිර්මාණය වූ අනු රූ බුදුපිළිමය සඳහා උන්වහන්සේගේ අනුමැතිය ලබා දී ඇත. මේ අනුව ඉදිකිරීමේ කටයුතුවල අවසන් අදියර ආරම්භ කරමින් මූර්ති ශිල්පී එම්. එම්. ගුණපාල මහාත බුදු පිළිමය නෙළීම ආරම්භ කර ඇත.

# අප ගැන අපට සතුටුයි

## කාන්තා කමිටුව



මේ අවුරුද්දේ ගත වූ කාල සීමාව දෙස හැරී බලද්දී මෙත් සවිය සාමාජිකාවන් වශයෙන් මෙන්ම කාන්තා කමිටු සාමාජිකාවන් වශයෙන් අපගෙන් ඉටු වූ කාර්ය භාරය පිළිබඳ යම් තරමකට සෑහීමට පත්විය හැකි වීම සතුටට කරුණකි. ඒ පිළිබඳව මහාචාර්ය තුමන්ගේ මාර්ගෝපදේශකත්වය ගෞරවයෙන් යුතුව සිහිපත් කරන අතරම සියලුම සාමාජික සාමාජිකාවන් වෙතින් ලද සහයෝගය අගය කරන්නෙමු.

පසුගිය වෙසක් සමයේ බෞද්ධාලොක මාවතේ වෙසක් කලාපය තුළ අප විසින් දියත් කරන ලද බුදු පිළිම වහන්සේ නිර්මාණය කිරීමේ කටයුත්ත උදෙසා ආධාර මුදල් රැස් කිරීම අප හැමදෙනාටම සුවිශේෂ අත්දැකීමක් විය. ආරම්භයේ පටන්ම එය සාර්ථක ප්‍රතිඵල ගෙන දුන් නමුත් පසුව අවාසනාවකට මෙන් එයට ද බාධක මතුවිය. බෞද්ධාලෝක වෙසක් කලාපයෙන් බැහැරව සිදු කරන එකතු කිරීම් නුසුදුසු බවට අදහසක් බාහිරව ඉදිරිපත් විය. මහාචාර්ය තුමන්ගේ ද අනු දැනුම ඇතිව කණගාටුවෙන් වුවත් අපට එම වැඩ පිළිවෙල නවතා දැමීමට සිදුවිය. ආරම්භයේ සුළු කාලයක් ඇතුලත අප විසින් සැලකිය යුතු මුදලක් ආධාර වශයෙන් එක් රැස් කර තිබුනි. එම වැඩිපිළිවෙලේ දී ද අනෙකුත් වැඩ කටයුතුවල දී මෙන්ම තරුණ සාමාජිකයන් ලබාදුන් සහයෝගය ඉතාමත් අගනේය.

බුදු පිළිම වහන්සේගේ ඉදිකිරීම් කටයුතු නිමා කිරීමට භාරදූර කර්තව්‍යයකි. අති විශාල මුදලක් එයට වැයවේ. පුද්ගලිකව ආධාර පිරි නැමීමට අමතරව අප ම සාමාජිකාවන් විසින් තව තවත් හැකි පමණින් සුළු වශයෙන් හෝ ගෙන ඒ සඳහා ආධාර උපකාර කළයුතුබවට අදිටන් කරගත තිබුනි.

රැස්වීම් වාර අවසානයේදී මහා පරිමාණයෙන් නොව සුළු වශයෙන් සාමාජිකාවන් විසින් තම ගෙවතු වලින් නෙලාගත් වස විසෙන් තොර එළවළු පළතුරු ඖෂධීය කොළ වර්ග සාමාජික සාමාජිකාවන් අතර අලෙවිය සඳහා තබන්නට පටන් ගැනුනේ ඒ අනුවය. කාන්තා කමිටු සාමාජිකාවන් වෙහෙස නොබලා රැස්වීම් වලට එන විට මෙවැනි ද්‍රව්‍ය රැගෙන එන අතර මිලක් නියම නොකර ලබා ගන්නා අය විසින් තමන්ට සුදුසුයයි හැඟෙන අවස්ථානුකූලව තමන්ට හැකි මුදලක් පරිත්‍යා කර මේ සියලු ද්‍රව්‍ය ඉතාම සුළු වේලාවක් තුල ලබා ගැනීම සතුටට කරුණකි. සුළුවෙන් නමුත් සතිපතා මෙලෙස එකතුවන මුදල් පිලිම වහන්සේ නිම කිරීම සඳහා ලබා දීමට හැකිවීම පිළිබඳව සියලුම සාමාජිකාවන් ඉමහත් සතුටට පත් වන බව ඔවුන්ගේ කතා බහෙන් පැහැදිලි වේ. මෙම වැඩ පිළිවෙල මීට වඩා ව්‍යාප්ත කර වැඩි දෙනෙකුට යහපතක, ප්‍රයෝජනයක් වන අන්දමට සිදු කරන අන්දම ගැන මහාචාර්ය තුමන්ගේ මග පෙන්වීම ඉල්ලා සිටීමටත් සියලු සාමාජික සාමාජිකාවන්ගේ අදහස්, යෝජනා ලබා ගැනීමටත් අප කාන්තා කමිටු සාමාජිකාවන් බලාපොරොත්තු වෙති.

අපේ සියලු මහාචාර්ය තුමන්ගේ සංවිධායකත්වයෙන් පසුගිය ගං වතුර සමයේ ආහාර පාර්සල් බෙදා දීමේ කටයුත්තක් සිදු කෙරුනි. එම කටයුත්ත සඳහා ශ්‍රම දායකත්වය සැපයීමට ලැබීම අප කාන්තා කමිටු සාමාජිකාවන් සළකන්නේ පූජ්‍ය කර්මයකට සහභාගි වීමට ලැබුන මාහැඟි අවස්ථාවක් ලෙසිනි. ගේදොර වැඩකටයුතු, පවුලේ අයගේ වැඩ කටයුතු සියල්ලක් අතරින් කෙසේ හෝ මේ වැඩසටහන් සියල්ලටම සහභාගි වන අපේ කාන්තා කමිටු සාමාජිකාවන් මෙත් සවිය වෙනුවෙන් කරන කැපවීම් අගේ කළ යුතුමය.

පසුගියදා ආරම්භ වූ නායකත්වය පුහුණු වැඩ සටහන් සඳහා සහභාගි වීම පිලිබඳව විශේෂයෙන් සඳහනක් කළ යුතු කරුණක් ඇත. එනම් අප සාමාජිකාවන් මේ වැඩසටහන සඳහා සහභාගි විය යුතු බවට තීරණය කර ඒ සඳහා ඔවුන්ව පෙළඹවීම සිදුකරන ලද්දේද මහාචාර්ය තුමන්ම විසිනි. බාහිර පිරිසක් විසින් මෙහෙයවනු ලබන මෙම වැඩසටහන සඳහා සැළකිය යුතු මුදලක් වැයවන බව අපි දැන සිටියෙමු. ඒ පිළිබඳව අප කරදර නොවිය යුතු බව මහාචාර්ය තුමන් අපට දන්වා සිටියද එසේ නොව අපත් මේ සඳහා දායකත්වය ලබා දිය යුතු බව අප කාන්තා කමිටු

තීරණය කරන ලදි. මේ සෑම දෙයකින්ම පැහැදිලි වන කරුණ නම් කාන්තා කමිටු සාමාජිකාවන් විසින් මෙත් සවිය මෛත්‍රී සංසදයේ වැඩ පිළිවෙල සඳහා අතිශය ක්‍රියාකාරීව සහභාගී වන බවයි. එසේ සිදු කළ හැකිව තිබෙන්නේ කරුණු කිහිපයක් මුල් කරගෙනය.

පළමුවැන්න මහාචාර්ය තුමන්ගේ ගෞරවනීය මග පෙන්වීමයි.

දෙවැන්න තරුණ කමිටු සාමාජිකයන් ඇතුළුව සියලුම සාමාජික සාමාජිකාවන් විසින් අප වෙත ලබා දෙන සහයෝගයයි.

වැදගත්ම කරුණ නම් කාන්තා කමිටු සාමාජිකාවන් අතර ඇති එකමුතු භාවයයි. සියලුම කටයුතුවලදී නොපැකිලව, එකාමෙන් ඉදිරියට පැමිණ පුදුමාකාර සහයෝගයකින් උනන්දුවකින් කටයුතු කිරීම ඇත්තෙනම් අගය කළ යුතුය. මෙලෙස අප සැම එක්ව කටයුතු කිරීමට ලැබීම ජීවිතයේ අප ලද භාග්‍යයකි.

**විනීතා රංජනී උඩුගොඩ - සෝමා දිගල්ල**
**මෙත් සවිය කාන්තා කමිටුව - ලේකම්**
**හේමන්ති, මිල්ඩා, විජේතුංග, තමන්නා, මියුරියල්**



# ගසේ තිබියදී ම බුදුන්ට මල් පූජා කිරීම

**කුසුමං වුල්ලිතං ඒතං - පග්ගහෙත්වාන අඤ්ජලිං**
**බුද්ධසෙට්ඨං සරිත්වාන - ආකාසමපි පූජයේ**

යහපත් අරමුණෙන් බුදුන් උදෙසා මල් පිදීමෙන් යහපතක්ම සිදු වේ.

බුදුරජාණන් වහන්සේ ඇතුලු මහරහතන් වහන්සේලා 500 නමක් වෙත දෙන දානය ඇතුලු ලොව සියලුම දානයන්ට වඩා අනිච්ච, දුඛ, අනාත්ම මෙනෙහි වන භවනාව ස්වල්ප වේලාවක් වැඩීම තුළින් බොහෝ කුසල් අත්වන බව බුද්ධ දේශනාවයි. මේ අනු උදයට පිපී සවස පරවී යන සුවඳවත් මෙම මල් මෙන් අපගේ ජීවිතය ඇතුලු ලොව සියල්ල විනාස වී යන බව සිහි කරමින් බුදුන් වහන්සේට මෙම පිපී ඇති මල් පූජා වේවායි පතමින්, පූජේමි බුද්ධන් ආදී ගාථාවන් ගෙන් මල් පිදීම තුළින් මහත් කුසලයක් සහ බලවත් පිනක් ද අත් කර ගත හැකිය.

අවසානයේ සියලු දෙවියන්, බ්‍රහ්මයන් ඇතුලු පින් බලාපොරොත්තු වන සියල්ලටම පින් අනුමෝදන් කරන්න.



# චිරං ජයතු ඇදුරු තුමනි

විවිධ විෂයයන්හි පරතෙරට ගිය මහා උගතුන් බොහෝය. ආචාර්ය, මහාචාර්ය වශයෙන් ඔවුන් ගෞරව නාමයන්ගෙන් ද හැඳින්වේ. රාජ්‍ය අනුග්‍රහය ඉහල තනතුරු, වරප්‍රසාද, දීමනා ඔවුනට පිරිනැමේ. එවන් විද්වතුන් අතරින් කී දෙනෙකු තමන් උපන් රට ගැන, තමා අවට සිටින පිරිස් වලින් සැදුම් ලත් සමාජය දෙස නිවැරදි බැලුම් හෙලුවේ දැයි සැක සිතේ. සමාජයේ විවිධ තරාතිරම් වල විවිධ වයස් සීමාවල පසුවන ජාතික, ආගමික වශයෙන් කිසියම් මෙහෙවරක යෙදිය හැකි, එහෙත් ඒ සඳහා පෙළඹවීමක්, මංපෙත් හෙලිකරදීමක් නොලද පිරිස් ද සිටින බව බොහෝ විද්වත්හු අමතක කළහ. එසේ අමතක නොකළ උගතුන්, පිංවතුන් පිරිසක් ද මේ අතර වූයේ වාසනාවකයට.

ඇදුරුතුමනි, ඔවුන් අතරින් ද ඔබ විශිෂ්ඨය. එසේ කිවන්නට හේතු කාරනා ද තිබේ. ඔබ භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්ය වරයෙකි. ඔබේ විෂය පරිපථය අජ්ඣාකාශ පර්යේෂණ දක්වා විහිදේ. විශ්ව විද්‍යාලවල, පර්යේෂණාගාරවල, රජයේ සහ පෞද්ගලික ජනමාධ්‍ය වල ඔබ ඉහලින් ම කැපී පෙනෙන චරිතයකි. ඒ සියල්ල ම තිබිය දී ඔබ ශ්‍රේෂ්ඨ බෞද්ධ දර්ශනය ගුරුකොටගෙන, හුදෙක් සම්ප්‍රදායික ආගමික සංවිධානයක් ලෙසින් නොව නූතන ලෝකයේ නවතම සොයාගැනීමේ ඔස්සේ බිහි වූ මනෝවිද්‍යාත්මක පසුබිමක් ද ඇසුරු කරගෙන, මානසික වශයෙන් පිරිපුන් සමාජයට වැඩදායි දහස් සංඛ්‍යාත පිරිසක් ''මෙත් සවිය'' නමින් එකම සෙවනක් යටතට රැස් කරන්නේය.

එසේ ඔබ එක්කළ මේ පිරිස සමාජයේ විවිධ තරාතිරම් වලට අයත්ය. ඔවුන් අතර උගතුන් ද සාමාන්‍ය මට්ටමේ අධ්‍යාපනය ලද අය ද වෙති. සමාජීය වශයෙන් ඔවුහු වෙනස් වෙනස් මට්ටම්වලට අයත් වෙති. විවිධ රැකියාවන්හි නියුතු සහ ව්‍යාපාරිකයන් ද, විශ්‍රාමිකයන් ද මේ පිරිසට අයත් ය. විශේෂයෙන් ම ජීවිකාවබෝදය පමණක් නොව පොතපතින්, සමාජයෙන් ලද දැනුමින් ද පිරුණු වැඩිහිටියන් පමණක් නොව උද්යෝගිමත් තරුණ පිරිස් ද මේ අතර සිටීම සතුට ට කරුණකි.

මේ පිරිසට ඔබේ මග පෙන්වීම කොයිතරම් සාර්ථක වූයේ ද යත් ඔවුන් තුල සැඟවතිබූ මෙතෙක් කල් සමාජයට විදහා නොදැක්වූ කුසලතාවන් ප්‍රදර්ශනය කිරීමට ඔවුන් ඉදිරිපත් ව සිටිති. ඒ සියල්ල සිදුවන්නේ සමාජයේ යහපත උදෙසාමය. දහසකුත් වැඩකටයුතු, පුද්ගලික ජීවිතයේ වැඩකටයුතු අතරින් ඔබ කාලය කළමණාකරණය කොටගෙන අප වෙනුවෙන් ද ඔබේ කාලය මිඩංගු කිරීම ගැන අප තුල විශාල කෘතඥතාවක් පවතී.

මේ සියල්ල සටහන් කළේ ඔබේ උපන්දිනය වෙනුවෙන් ප්‍රශස්ති ගායනයක් ලෙසින් නොව, සැබවින් ම ඔබ ගැන අප හදවත් තුල පෙන්වන ආදරණීය, ගෞරවණීය හැඟුම් සමුදායක් ලෙසින් පමණි.


අපට හැකි ඉහලම අයුරින් අප දිනූ රටට, අපේ කටම බෞද්ධකමට සේවය කිරීමට ඉදිරි කාලයේත් ඔබේ මගපෙන්වීමට අපට වාසනා වේවා!

ඇදුරුතුමනි සුබ උපන්දියයක් වේවා!

(සැප්තැම්බර් 8 වන දින)

**රංජනී උඩුගොඩ ඇතුළු කාන්තා කමිටුව**

# අකල් මරණ අවමයට ඇමෙරිකානුවෝ **භාවනා** කරති...



මෛත්‍රී භාවනාව මඟින් මෙලොව දීම අත්වන ආනිසන්ස 11 ක් ගැන දහමේ සඳහන් වෙති. මෙම දහම් පණිවිඩය සත්‍ය බව බටහිර විද්‍යාඥයින් දැන් අනාවරණය කරගනිමින් පසුවෙති.

1992 පමණ වන කාලයේ ඇමෙරිකාවේ නාගරික රෝහල් වල සඳුදා දිනට පස් දෙනෙක් මිය යන බව පෙනී යන ලදී. මේ පිළිබඳව කරන ලද පර්යේෂණයන්හිදී වැදගත් කරුණු රාශියක් සොයාගැනීමට මඟ පෑදින. සති අන්තයේ තම ගම් බලා යන සේවකාදින් සඳුදා දින පෙරලා තම සේවය සඳහා සැතපුම් සිය ගණන් මග ගෙවා පැමිණීමේදී නගරයේ පවතින වාහන තදබදය හේතුවෙන් මොහුනට තම සේවාවට යාමට නියමිත කාලය මහ මඟ හිරවී සිටීමට සිදුවීම තුලින් මානසිකව බලවත් පීඩනයකට පත්වෙති. ඒ සමඟම ඇතිවන කේන්තිය හේතුවෙන් පෙනහලුවල නිපදවෙන කෝටිසොල් සාන්ද්‍රණය හදවත කරා ගමන් කිරීමේදී සිරුරේ පවතින ප්‍රතිශක්තිය දුර්වල වන බව අනාවරණය විය. මෙම දුර්වල ප්‍රතිශක්තියට පත් රෝගීන් අතර අධි රුධිර පීඩනය, කොලෙස්ටරෝල්, දියවැඩියාව ආදී විවිධ රෝගයන්ට තව දුරටත් ඔරොත්තු නොදෙන බැවින් එම රෝගීන් මිය යන බව අනාවරණය කරගත හැකිවිය.

මෙයට පිළියමක් සොයමින් සිටි විද්‍යාඥයිනට මෛත්‍රී භාවනාව යහපත බවට තොරතුරු ලැබින. මේ අනුව මෛත්‍රී භාවනාවේ පසුබිම හා එය සිදුකරන ආකාරය පිළිබඳව ප්‍රචාරය කිරීමෙන් පසුව එම මරණ ප්‍රමාණය සීඝ්‍රයෙන් අඩුවන බන පෙනී යන ලදී.

මෙයින් දිරිමත් වූ විද්‍යාඥයින් භාවනාව දියුණු ටිබෙට් රටේ කඳු ආශ්‍රිතව භාවනානුයෝගීන් හමු වී ඔවුනගේ සිරුරේ දත්තයන් නවතම යන්ත්‍ර මඟින් රැස්කර ගත්හ. මෙයට දලයි ලාමා තුමන් මෙම විද්‍යාඥයිනට බොහෝ ආධාර කර ඇත.

මෙම ලබාගත් දත්තයන් ඇමෙරිකාවේදී විවිධාකාරයෙන් පර්යේෂණයට ලක්කිරීමේ දී නවතම තොරතුරු රාසියක් අවායරණය විය. එතෙක් ලොව තිබූ මතය වූයේ මොලයේ විවිධ හේතූන් මත ශෛලයන් විනාශ වීමකදී නැවත ප්‍රකෘත්තිමත් නොවන බවට තිබූ මතය බිඳ හෙලමින් එම කොටස් යලි සුව වන බව පෙනීයන ලදී. සිහි කල්පනාව දියුණුවීම, මොලයේ වම් පස සහ දකුණු පස කලා විෂයන් හා විද්‍යා විෂයන්ට බලපාන අයුරුත් සොයා ගැනීම පෙරලියකට හේතු වන නොබෙල් ත්‍යාගයට සුදුසුකමක් වන හෙයින් ඒ සදිකා තොරතුරු ඉදිරිපත් කලද එමඟින් බොදු දහමට ලැබෙන මහා ප්‍රසිද්ධිය සහහර විට නොබෙල් ත්‍යාග කමිටුව නුරුස්සන්නක් වූවායැයි සැක කරති.

සොයාගත් නව තොරතුරු අතර දඩබ්බර සිසුවෙකුට දිනකට විනාඩි 40 ක් බැඟින් මෛත්‍රී භාවනාව හුරුකරවීමෙන් පසුව ඔහු හොඳ විනයකින් යුත් සිසුවෙකු වීමත් අධ්‍යාපනයට දක්ෂ වන බවත් පෙනීයන ලදී. මේ නිසා පාසැල්වල මෛත්‍රී භාවනාව පුහුණු කිරීම අරඹා ඇත. මේ සඳහා භික්ෂූන් වහන්සේලා අවශ්‍ය තරම් නොමැති කමින් පල්ලිවල පූජකතුමන්ලා එම කටයුතු අරඹා ඇත. එසේම මෙම දින 40 භාවනාව පාඨමාලාවෙන් පසුව ඔවුන් එතැන් සිට අද දක්වා මහත් සතුටෙන් සිටින බව හෙලිවිය. විවිධ රෝග සුවයටද හේතු වී ඇත. භාවනාව උපන් අප රටවල මෙම භාවනාව අනුගමනය කිරීමෙන් අකල් මරණ පමණක් නොව සෑහෙන දුරට මාරක විපත් ගෙන දෙන පෙර අකුසල් වල බලය පවා දුර්වල කල හැකි බව ආනාදිමත් කාලයක සිට බෞද්ධයෝ දැක සිටියහ. අවාසනාව ඉන් නිසි එල ලබා නොගැනීමයි. එසේම නින්ද අඩු අයට පැයක් දෙකක් භාවනා කිරීමෙන් එමෙන් දෙගුණයක කාලයක් නිදා ගත්තා හා සමාන බව පැහැදිලිය. මේ අනුව පැය දෙකක් පමණක් නිදා ගැනීමෙන් සියල්ල පැය 6 ක් නිදා ගත්තා සමානවන බව අනාවරණය වේ. අමතර කුසලයක් ද ලැබෙනු ඇත.



**විශ්‍රාමලත් විදුහල්පතිනී**

## ඩී. ඒ. ජයරත්න

**වන මාගේ මෑණියන්ගේ අවමංගල්‍යය කටයුතු වෙනුවෙන් නන් අයුරින් උදව් උපකාර කළ සෑම සියලු දෙනාටමත්, අවමංගල්‍ය කටයුතු සඳහා සහභාගී වූ සෑම සියලු දෙනාටමත්**

**මාගේ පුණ්‍යානුමෝදනාපූර්වක ස්තූතිය පුදකර සිටිමි.**

**- මහාචාර්ය චන්දන ජයරත්න -**

## මහියංගනයේ ඉදිවන බුද්ධ ප්‍රතිමාවහන්සේ නිර්මාණය කර ඉදිකිරීම සඳහා අවබෝධතා ගිවිසුම් ඇතිකරගැනීම සහ බුදුපිළියම නිර්මාණය අධීක්ෂණය කිරීම...








මහියංගනය රාජ මහා විහාරයේ ඉදිකරනු ලබන 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ නිර්මාණයකර ඉදිකිරීම සඳහා මෙත් සවිය, මහියංගන රාජ මහා විහාරාධිපති අති පූජ්‍ය උරුලෑවත්තේ ධම්මරක්කිත හිමිපාණන් සහ මූර්ති ශිල්පී ඇම්. ඇම්. ගුණපාල මහතා සමග ඇතිකරගත් අවබෝධතා ගිවිසුම සහ බුදු පිළිමය නිර්මාණය කරනා ස්ථානය අධීක්ෂණය කිරීම.

## ගරු චන්දන ජයරත්න ගුරු පියාණන්ගේ සහ දියණියගේ ජන්ම දිනය නිමිතිකොට මෙත් සවිය මගින් පවත්වන ලද පිංකම් මාලාව...












මෙත් සවිය

# 14 වන සංවත් මෛත්‍රී

2017 අප්‍රේල් 02

සුවිශේෂී දේශීය
























# ...සර් සැමරුම් සහ
# භූෂණ උපහාර උළෙල

සහ ආයුර්වේද වෛද්‍යවරුන් උපහාරයට පාත්‍ර වූ වගයි...



ප්‍රධාන අමුත්තා වන කුඩා කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මහතා අතින් අනුරාධපුරයේ, විශේෂඥ නාඩි වෛද්‍ය සරත් සෝමසිරි ගුණවර්ධන වෙද මහතා ට සහ බුලංකුලමේ, විශේෂඥ අක්ෂි වෛද්‍ය පී. වීරසිංහ වෙද මහතාට මෛත්‍රී භූෂණ වෛද්‍ය චක්‍රවර්තී ගෞරව සම්මාන පිරිනමන අවස්ථාව



මෛත්‍රී භූෂණ සම්මාන උත්සවයේ අවස්ථා කිහිපයක්...



කම්ටු සාමාජිකයින් සඳහා විශේෂ ඇගයීම් සම්මාන ප්‍රදාන කිරීම.



අසරණ පවුල්වල ඉගෙනුම ලබන දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.



උත්සවය නිමාවෙන් පසු පූජ්‍ය බොරැල්ලේ කෝවිද හිමියන් විසින් පවත්වන ලද ධර්ම දේශනාව.

# බණ පොතෙන් බිඳක්...



## කසාවතට හිමි - අහිමි පුද්ගලයා

### අනික්කසාවෝ කසාවං - යෝ වත්ථං පරිදහෙස්සති
### අපේතෝ දමසච්චේන - න සෝ කසාවමරහති

ඉඳුරන් දමනයෙන් හා ඇත්ත කීමෙන් බැහැර වූ දුසිල් තැන්ත්තා සිවුරක් දරයි නම් ඔහු කිසිසේත් සිවුර දැරීමට සුදුසු නොවේ.

### යෝ ච වන්තකසාවස්ස - සීලේසු සුසමාහිතෝ
### උපේතෝ දමමසච්චෙන - ස වේ කාසාවමරහති

ඉඳුරන් දමනයෙන් හා ඇත්ත කීමෙන් යුතු සිල්වත් තැනැත්තා සිවුරක් දරයි නම් ඔහු ඒකාන්තයෙන් සිවුරු දැරීමට සුදුසු වෙයි.

කෙලෙස් කසට දුරු නො කළ ඉන්ද්‍රිය දමනයෙන් හා සත්‍ය වචනයෙන් තොර තැනැත්තා සිවුරු දැරීමට නුසුදුසු බවත්, කෙලෙස් කසට දුරු කළ ඉන්ද්‍රිය දමනයෙන් හා සත්‍ය වචනයෙන් යුක්ත තැනැත්තා සිවුරු දැරීමට සුදුසු බවත් දැක්වීමට දෙව්දත් තෙරුන් අරබයා මෙම කථා පුවත සැවැත් නුවර දෙව්රම් වෙහෙර දී භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

රජගහ නුවරවාසී සැදැහැවතුන්ගේ ආරාධනාව පිළිගෙන සැරියුත් මුගලන් අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා දෙනම දහසක් භික්ෂූන් වහන්සේලා සමග එහි වැඩියහ. නුවර වැස්සෝ එකතුව වාසය කිරීමට සේනාසන සකසා දී පසුව දන් පිළියෙල කොට පිළිගැන්වූහ. දන් වළදා අවසානයෙදී සැරියුත් මහතෙරුන් වහන්සේ අනුමෝදනා බණ මෙසේ වදාළහ.

## දන් දෙන විට මේ ගැනත් සිතන්න...

1. යමෙක් දන් දෙන විට අනුන් සහභාගී කරවා නො ගනියි නම්, ඔහු උපනුපන් ආත්ම වලදී භෝග සැප පමණක් ලබයි. පිරිවර සම්පත් නො ලබයි.

2. යමෙක් දන් දෙන විට අනුන් සහභාගී කරවා ගෙන ඔවුන් ලවාම දෙයි. තමා දන් නොදෙයි නම්, ඔහු උපනුපන් ආත්ම වලදී පිරිවර සම්පත් පමණක් ලබයි. භෝග සම්පත් නො ලබයි.

3. යමෙක් තමාද දන් නොදෙයි. අනුනුත් සහභාගී කරවා නොගනියි. ඔහු උපනුපන් ආත්ම වලදී භෝග සැප මෙන් ම පරිවාර සැප ද නො ලබයි.

4. යමෙක් තමුනුත් දෙයි. අනුනුත් සහභාගී කරවා ගනියි. ඔහු නිරතුරු භෝග සැප මෙන් ම පරිවාර සැප ද ලබයි.

මේ අනුව දහම් දෙසුම අසා පැහැදුණු සිතැති නැණවත් මිනිසෙක් සියලු දෙනාම සහභාගී කරවා ගෙන දානයක් පූජා කිරීමට සිතුවේය. ඒ සඳහා ඉක්මනින් කටයුතු සංවිධානය කර ගත් අතර ම දානය පිදීම සඳහා ස්ථානයක් නියම කර ගත්තේය. රජගහ නුවර ජනතාව මහත් ශ්‍රද්ධාවෙන් ආහාර පාන වර්ග මෙන් ම පිරිකර වර්ග ද සූදානම් කර ගත්හ. ඉසුරුමත් කෙනෙක් සුවඳ කැවූ පිළියෙන් කරන ලද සිය දහස් වටිනා සිවුරක් පූජාව සඳහා ගෙනැවිත් තිබුණේය. පින්කමට සහභාගී වූ බොහෝ දෙනා 'මේ සිවුර දෙව්දත් තෙරුන්ට පුදමු' යැයි පවසන්නට වූහ. ඔවුහු 'උන් වහන්සේ අපේ සියලු දේකටම සහාය වේ. මඟුල් අවමඟුල් ලෙඩදුක් නිතර සොයා බලති. එබැවින් දෙව්දත් තෙරුන්ට පුදමු' යි කීහ. එම පූජා කිරීම සියලු දෙනාගේ සතුටට හේතු නොවූහ.

දෙව්දත් හිමියෝ අඟනා සිවුර පොරවාගෙන ඇවිදී. මේ සිවුර මේ හාමුදුරුවන්ට සුදුසු නොවේ. සැරියුත් තෙරුන්ට නම් ඉතා හොඳය' යි සැදැහැවත්හු පැවසූහ. මේ කාරණය නොයෙක් දෙනා අතර කතා බහට ලක්විය. ඔවුන් අතර පැවති මේ කතා බහ භික්ෂූන් වහන්සේලා අතර ද පැතිර බුදුරජාණන් වහන්සේට ද සැළ විය. එවිට බුදුරජාණන් වහන්සේ අතීත පුවතක් භික්ෂූන් වහන්සේලාට වදාළ සේක.

දෙව්දත් තෙර පෙර ආත්මභවයක දී වැදි කුලයෙක ඉපදී සතුන් මරමින් වනයෙහි හැසිරෙන විට දී, එහි වැඩ සිටි පසේ බුදුරජාණන් වහන්සේට ඒ අසලින් යන ඇත් රංචුවක් වැඳ යන අයුරු දුටුවේය. ඒ දැක උන් වහන්සේගෙන් ම සිවුරක් සොරා ගෙන පොරවා ගෙන වනයේ සිටි ඇතුන් නසන්නට විය. මේ පුවත නිමිති කොට ගෙන කෙලෙස් කසට දුරු නොකළ, ඉඳුරන් දමනය නොකළ, සත්‍ය වචන කතා නොකරන තැනැත්තා සිවුර දැරීමට නුසුදුසු බව හා කෙලෙස් කසට දුරු කළ, ඉඳුරන් දමනය කළ, සත්‍ය වචන කතා කරන තැනැත්තා ම සිවුර දැරීමට සුදුසු බව බුදුරජාණන්වහන්සේ වදාළ සේක.



# සම්බුද්ධත්ව ජයන්ති බුදු පිළිමය ලද පසු...

**අ**සූ හාරදහසක් ධර්මස්කන්ධය සංකේතවත් කරමින් අඩි 84 ක් උසැති මහියංගන පුදබිමෙහි සම්බුද්ධත්ව ජයන්ති බුද්ධ ප්‍රතිමා වහන්සේ ඇඹීම මෙත් සවිය මනස අධ්‍යාපන මෛත්‍රී සංසදය විසින් අරඹා ඇත.

2012 වසරේ ආරම්භයේ දී බුදු පිළිමය සඳහා අපේක්‍ෂිත වියදම මෑතකදී තුන් ගුණයකට වැඩිවීම හේතුවෙන් මෙත් සවිය වගකිවයුතු පිරිසගේ හදවත් තුළ ඇති වූ කම්පිත සිතිවිලි වායුගෝලයට මුසු වූ බව පැහැදිලිය. මේ පිළිබඳව ඇසූ විට මට සිතුනේ වීර්‍ය්‍ය වඩා කෙසේ හෝ එම කාර්යය සාර්ථක කරගත යුතු බවය.

මේ කාලයේ දී එතරම් මුදලක් මා වෙත ඉතිරි කර නොතිබුණාත් තන්හාව පරදා දානමය චින්තනය ඉස්මතු විය. මම නිර්ලෝභීව ලක්‍ෂයකට වැඩි මුදලක් පූජා කර ''බුදු පිළිමය බාධකයන්ගෙන් තොරව ගොඩනැගේවා!'' යයි මුළු හදවතින් ම ප්‍රාර්ථනා කළෙමි.

මා තිළිණ වශයෙන් ලද සංකේතමය බුදු පිළිමය මගේ නිවසෙහි තැන්පත් කර මෙත් සවිය නිර්මාතෘ මහාචාර්ය චන්දන ජයරත්න ගුරුතුමාගේ උපදෙස් පරිදි පංච වර්ණ මල් පූජා කර උජු, සුජු, මෘදු, සුවච, අනතිමානී ගුණ වඩමින් යහපත් වූ ප්‍රාර්ථනාවන් කළෙමි.

ඉතා ඉක්මනින් මාගේ ජීවිතය යහපත් වන්නට විය. ප්‍රාර්ථනාවන් ක්‍රමයෙන් ඉටු වන්නට විය. ආර්ථිකය සරු වන්නට විය. යටපත්ව තිබූ රෝග මතු වෙමින් ඒවාට ප්‍රතිකර්ම සාර්ථකව යෙදෙන්නට විය. බාලයන් හඳුනා ගන්නට ලැබී එම ඇසුර ඉවත් වෙමින් කල්‍යාණ මිතුරන් ලං වන්නට විය. බුදු සමිඳුන්ගේ ගුණ මහිමය වඩ වඩා පැහැදැලි වන්නට විය. අවබෝධ කර ගැනීමේ ශක්තිය දියුණු වනු දැනේ. මේ සියල්ල ක්‍රමාණුකූලව සිදු වෙමින් පවතී.

මෙම ප්‍රාතිහාර්යමය බුදු පිළිමය අබියස පංච වර්ණ මල්, පහන්, සුවඳ දුම් පුදා ඒ පින මෙත් සවිය සංවිධානයේ සියළුම දෙනාට මෙන්ම විශ්වයේ තිස් එක් තලයක සිටිනා සියළු සත්ත්වයන්ට අනුමෝදන් කරමි. මේ මහා පරිත්‍යාගමය පුණ්‍යකර්මය මා ආලෝකයෙන් ආලෝකයට ගෙන යනු දැනේ.

---

**හේලි අමා සෙනරත් - සා. අංක (5 - 1039)**



# මෙත් සවිය දාන - සීල - භාවනා කමිටුවේ ප්‍රගතිය

අප අනු කමිටුව මෙත් සවිය තුල ඇති ආධුනිකම අනු කමිටුව වෙයි. අප කමිටුව 2017 වසරේ සංවත්සර මහා සභාවෙන් පසුව ආරම්භ කරන ලදී.

දාන - සීල - භාවනා කමිටුව විසින් පසුගිය මාස කිහිපය තුල, මෙත් සවිය ගරු සභාපතිතුමා වන මහාචාර්ය චන්දන ජයරත්න ගුරුපියාණන්ගේ අනු දැනුම සහ අනුමැතිය ඇතිව පහත සඳහන් කාර්යයන්හි නියෙලෙන ලදී.

- 2017 වර්ෂයේ ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ කඨින පිංකමට සමගාමීව සංවිධානය කරන ලද පෝය දින සීල ව්‍යාපාරයේ දී අප කමිටුවු විසින් සිල්ගත් උවැසි, උවැසියන් වෙනුවෙන් දානය, ගිලන් පස පිළිගැන්වීමේ කටයුතු සඳහා උපරිම ශ්‍රම දායකත්වය සපයන ලදී.



- 2017 දෙසැම්බර් මස 1 වන දින මහියංගනය සදහම් චාරිකාවට සහභාගී වූ සියලුම පිංවතුන් වෙනුවෙන් ඒ සඳහා අවශ්‍ය බස් රථ සැපයීම, දහවල් දානය සැපයීම, සවස කෙටි ආහාරය සැපයීම ආදී කටයුතු සංවිධානය කරන ලදී.
- සදහම් චාරිකාවට සහභාගී වූ සියලුම දෙනා සඳහා අවශ්‍ය පානීය ජලය සැපයීම අප අනු කමිටු සාමජිකයන් සහ ජනවාරි මස උපන් සාමජිකයන්ගේ දායකත්වය ලබාගෙන එම කටයුතු සාර්ථකව කරන ලදී.
- 2018 ජනවාරි මස 01 වන දින ගංගාරාම විහාරස්ථානයේ උදෑසන හීල් දානය සැපයීමේ කටයුත්තට උපරිම ශ්‍රම දායකත්වය සැපයීම සඳහා කටයුතු කිරීමට අප කමිටුව බලාපොරොත්තුවෙන් සිටිමු.

මෙම කටයුතු සංවිධානය කිරීමට අප අනු කමිටුව තුල අන්තර්ගත වී ඇත්තේ 8 දෙනෙකුගෙන් සමන්විත පිරිසකි. එබැවින් අප අනු කමිටුව නව පුළුල් කරගනිමින් 2018 වසර තුල වඩාත් ඵලදායි ලෙස දාන-සීල-භාවනා වැඩසටහන් සඳහා උපරිම සංවිධාන දායකත්වය ලබා දීමට අප අනු කමිටුව වශයෙන් බලාපොරොත්තු වෙමු.




# ඔවදන් කිහිපයක්

- ඔබ පරීක්ෂාකර බැලිය යුත්තේ ඔබට නැති වූ දේ පිළිබඳව නොව ඔබව අමතක වූ දේ පිළිබඳවයි.
- මලක් පිබිදෙන විශ්මය ඔබට පිළිගන්නට පුළුවන් නම් මුළු ජීවිතය අඳුනා ගන්න ඔබට පුළුවනි.
- අළුත් ජීවිතයක් දිනාගන්නට පරණ ජීවිතයට සමුදීමට ඔබට ආත්ම ශක්තියක් තිබිය යුතුය.
- ශ්‍රේෂ්ඨ මිනිස්සු තමන්ට අවස්ථාව ලැබෙන්නේ නැතැයි කියා මැසිවිලි නගන්නේ නැත.
- සැබෑ උගතාගේ මුඛ්‍ය ලක්ෂණය විය යුත්තේ හික්මීමයි.
- ජාතිවාදය මානව වර්ගයා දුර්වල කරන රෝගයකි. (ඇල්බට් අයින්ස්ටයින්)
- කෙනෙකුගේ වරදක් ගැන කියන්න ඔබව සිතුනේ නම් ඔහුගේ සියළු හොඳ දේ ගැන සිතන්න.
- තමන්ගේ ආලෝකයෙන් ඉදිරියට යාමට පුළුවන් කම තිබියදී අනුන්ගේ සෙවනැලිවල පිහිට පතන්නේ ඇයි?
- ඉවසන්නාට ලොවිතුරා සුවය ළඟාකරගත හැක.
- අහන්නෙක් වෙන්න ඕන, බලන්නෙක් වෙන්න ඕන, ක්‍රියාකරන්නෙක් වෙන්න ඕන, ප්‍රතිඵල ලබන්නෙක් වෙන්න ඕන.

**අශෝකා හේමමාලී ජයතිලක**
**සාමජික අංක 08-1510**

**මෙත් සවිය වෙබ් හා මාධ්‍ය කමිටුව විසින් පවත්වනු ලබන, මෙත් සවිය සාමාජිකයින්ගේ සහ පවුල් වල අයගේ පරිගණක දැනුම වැඩිකරලීම සඳහා පැවැත්වීමට නියමිත සති අන්ත තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාවට අයදුම්පත් කැඳවනු ලැබේ.**




මෙත්සවිය වෙබ් සහ මාධ්‍ය කමිටුව මගින් 2018 ජනවාරි මස සිට තොරතුරු තාක්ෂණය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට කටයුතු සලස්වා ඇත. මේ සඳහා මෙත්සවිය සාමාජිකයින්ට සහ සාමාජිකයින්ගේ පවුල් වල සාමාජිකයින්ට සහභාගී විය හැක. සාමාජිකයින් ගේ දැනුම පුළුල් කිරීමත් නවීන තාක්ෂණය එදිනෙදා ජීවිතයට අවශ්‍ය ලෙස යොදා ගැනීම පිලිබඳ දැනුවත්භාවයක් ඇති කිරීමෙන් සිදුකෙරෙන මෙම වැඩසටහන සති අන්තයේ පැවැත්වීමට නියමිතය.

වයස් සීමාව සහ දැනුම් මට්ටම අනුව වැඩසටහනට යොමු කරනු ඇති අතර වැඩසටහන අවසානයේ සහතික පත්‍රයක් ද පිරිනමනු ලැබේ. මෙම වැඩසටහන සඳහා බරපැන ගාස්තු කාර්යලයේ කටයුතු පුළුල් කිරීම සඳහා යොදවනු ලැබේ.

- **තොරතුරු තාක්ෂණයේ මූලික සංකල්ප** (Basic concepts of IT)
- **මෙහෙයුම් පද්ධති** (Operating Systems)
- **පරිඝණක දෘඩාංග** (Momputer Hardware)
- **මෘදුකාංග පද්ධති සහ ක්‍රමාංකනය** (Software Systems and Development)
- **ජාලකරණය** (Networking and Wifi)
- **අන්තර්ජාලය, ඊමේල් සහ සන්නිවේදන පද්ධති** (Internet, E-mail and Messaging Systems)
- **සමාජ මාධ්‍ය ජාල** (Social Media)
- **කාර්යාල සඳහා පැකේජ** (Office Packages)
- **ගිණුම්කරණය සඳහා පැකේජ** (Accounting Packages)
- **නව ජංගම උපාංග** (Smart Mobile Devices)
- **තොරතුරු ආරක්ෂණය** (Information Security)
- **තොරතුරු තාක්ෂණයේ නව නැඹුරුතා** (New trends in IT)

**විමසීම්:**
**කාර්යාලය** : 011 2 505 088 / 071 401 4467
**මංජුල** : 071 529 5855
**අයදුම්පත් කාර්යයාලයට ලබාදෙන්න...**

## භාවනාව ඉගෙන ගන්නා කාලය තුල ඔබගේ ළමුන් සඳහා...

**IT සහ தமிழ்**

මෙත් සවියට සහභාගී වන සමාජිකයන් භාවනාව ඉගෙන ගන්නා කාලය තුල (ප.ව. 2-5) තමන් සමගින් පැමිණෙන දරුවන් හට තොරතුරු තාක්ෂණය සහ දෙමළ භාෂාව ඉගැන්වීමට කටයුතු සම්පාදනය කරමින් පවතී. මේ සඳහා සහතික පත්‍රයක් ද නිකුත් කිරීමට නියමිතය. 2018 ජනවාරි මස 13 වන දින මෙම පන්ති ආරම්භ කෙරේ.

අයදුම්පත්‍රය සහ වැඩි විස්තර සඳහා මෙත් සවිය කාර්යාලය අමතන්න.

මෙහි පළමු කොටස පසුගිය කලාපයේ පළ විය...

# කෙලෙස් 1500

**3 වන කොටස...**

## 3. ආරෝග්‍යමදෝ

නිරෝගී භාවය නිසා ඇති වන මත, උඩගු බව **ආරෝග්‍යමද** නම් වේ. මේ මිනිස් ලොම්පූර්ණයෙන් නිරෝගී පුද්ගලයෙක් නැත. ඇතුන් දහසක බල ඇති බුද්ධ ශරීරයේ ද නොයෙක් රෝග හට ගත්තේය. සෙස්සන් ගැන කියනුම කිම? ශරීරය රෝග හට ගන්නා ස්ථානය ය. ජලය ඇති තැන මසුන් ඇති වන්නාක් මෙන් ශරීරයක් ඇතොත් රෝග හට ගන්නේ ය. එබැවින් නකුලපිතු නම් ගෘහපතියාට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

**"ආතුරොහයං ගෘහපති කායෝ අණ්ඩභූතො පරියොනන්ධො. යො හි ගෘහපති ඉමං කායං පරිහරන්තො මුහුත්තම්පි ආරෝග්‍යං පටිජානෙය්‍ය, කිමඤ්ඤත්‍ර බාල්‍යා?"**

(සංයුක්ත නිකාය ඛන්ධවග්ග)

ගෘහපතිය, මේ කය රන් පැහැ ඇත්තියක් වුවද නිතර අපවිත්‍ර දෑ උතුරන වැගිරෙන එකක් බැවින් ආතුර ය. දුබල බැවින් බිජුවක් බඳුය. දුබල සමකින් වැසී ඇත. ගෘහපතිය, යමකු මේ කය පරිහරණය කරමින් මොහොතකට හෝ නිරෝගී බව පවසනවා නම් එය මෝඩ කම මිස අන් කුමක්ද? යනු එහි තේරුම ය.

සාගින්නත්, රෝගයකි. පිපාසයත් රෝගයකි. ශරීරයෙන් දහඩිය කෙළ සෙම් සොටු මලමුත්‍ර ගැලීමත් රෝගයකි. එක් ඉරියව්වකින් වැඩි වේලාවක් සිටිතහොත් වේදනා හට ගැනීමත් රෝගයකි. මේ රෝග කාහටත් නිරන්තරයෙන් ඇත්තේ ය. සෙම්ප්‍රතිශ්‍යාව කැස්ස උණ වමනය විරේචනය පීනස අර්ශස් කුෂ්ටය පිළිකාව යනාදි රෝග ස්ථිර වශයෙන් නො වැළඳෙන ශරීරයක් නැත. ඇතැම්හු රෝග බහුලයෝ ය. ඇතැමුන්ට රෝග මඳය. ධර්මයෙන් ඈත්ව වාසය කරන්නා වූ ඇතැමුන්ට නිතර රෝග වලින් පෙළෙන අය දුටු විට තුමු නිරෝගීය කියා රෝගීන් පහත් කොටත් තමන් උසස් කොටත් ගන්නා මානයක් ඇති වේ. එය දියුණු වීමෙන් ආරෝග්‍යමදය නමැති මත ඇති වේ. එහි ආදීනවය තථාගතයන් වහන්සේ විසින් මෙසේ වදාරා ඇත්තේ ය.

**"ආරෝග්‍යමද මත්තෝ වා භික්ඛවේ, අස්සුතවා පුථුජ්ජනෝ කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති. මනසා දුච්චරිතං චරති. සෝ කායේන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භේද පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජති"**

(අංගුත්තර නිකාය තික නිපාත)

"මහණෙනි ආරෝග්‍ය මදයෙන් මත් වූ නූගත් පෘථග්ජන තෙමේ කයින් ද පව් කරයි. වචනයෙන් ද පව් කරයි. සිතින් ද පව් කරයි. හෙතෙමේ පව් කොට මරණින් මතු සැපයෙන් පහත වූ අපායෙහි උපදිය" යනු එහි අදහසයි.

ආරෝග්‍ය මදයෙන් මත් වූ ඇතැම්හු අන්‍යයන්ට ලෙඩ හැදුනාට අපට සෑදෙන්නේ නැත කියා ශරීරයට අහිත දේ කා බී, පමණ ඉක්මවා ඇතැම් ක්‍රියා කොට නුසුදුසු සේ හැසිර රෝග සාද ගනිති. එය ද ආරෝග්‍ය මදයෙන් වන එක් අන්තරායකි.

## 4. යොබ්බනමදෝ

ජරාව එක්තරා සංවේග වස්තුවකි. එහෙත් නුවණ මඳ තරුණයන්ට තරුණමදය නිසා මහල්ලන් දුටු විට ඔවුන් දුබලයන් කොට මෝඩයන් කොට පහත් කොට පිළිකුල් කොට සලකන තමා උසස් කොට ගන්නා මානය ඇති වේ. කළ යුත්ත නොකළ යුත්ත නො දැනෙන පමණට වැඩුණා වූ ඒ මානය යොබ්බනමද නම් වේ. යෞවන මදය, තරුණ මදය යන මේවා ද එහි නම් ය. වැඩි මහල්ලෝ බාලයන් විසින් ගරු කළ යුත්තෝ ය. රහත් භික්‍ෂුව විසිනුදු වැඩි මහලු පෘථජන භික්‍ෂුවට ගරු කළ යුතු බව වැඳිය යුතු බව බුද්ධ නියමය යය. යෞවන මදයෙන් මත්වුවෝ මහල්ලන්ට විසුළු කරමින් ඔවුනට කරදර කරති. එය මහත් පාපයකි. ගුණවත් මහල්ලන්ගේ සිත් රිදවන තරුණයන්ට සමහර විට එයින් වන අනිෂ්ඨ විපාක මොලොවදීමත් ලැබෙන්නේය. වැඩිමහල්ලෝ ද එක්තරා පූජනීය කොට්ඨාසයකි. එබැවින් ඔවුනට ගරු කළ යුතු ය. වැඩිමහල්ලන්ට ගරු කිරීමේ අනුසස් මෙසේ වදරා ඇත්තේ ය.

**යේ වුද්ධ මපචායන්ති - නරා ධම්මස්ස කෝවිදෙ**
**දිට්ඨෙව ධම්මේ පාසංසා- සම්පරායේ ච සුග්ගති**

(ජාතක පාලි)

"වැඩි මහල්ලන්ට ගරු කිරීමට දන්නා වූ අය යම් මිනිස් කෙනෙක් වෘද්ධයන්ට ගරු බුහුමන් කෙරෙත් ද ඔවුහු ඉහත ආත්මයෙහි ප්‍රශංසා ලබන්නෝ ද මරණින් මතු සුගතියෙහි උපදින්නෝ ද වෙත් ය" යනු එහි තේරුමය.

තරුණ මදය දෙලොව ම පිරිහීමට හේතුවන නපුරු මදයකි. තරුණ මදයෙන් මත් වුවෝ කාරුණික වූ ද හිතකාමී වූ ද මාපියන්ගේ අවවාද අනුශාසනයන් නො පිළිගනිති. ඕවා මහල්ලන්ගේ මෝඩ අදහස් ය. කියා අවමන් කර ධර්මය නො පිළිගනිති. ඔවුහු ඕනෑ නීච ක්‍රියාවක් කිරීමට ලැජ්ජා නො වෙති. සොරකම් ආදී නීච ක්‍රියා දස්කම් ලෙස සලකති. ඕනෑ ම අපරාධයක් කිරීමට බිය නො වෙති. එයින් ඔවුහු මොලොවත් පිරිහී මරණින් මතු අපායට ද යති.

ඊළඟ සගරාවෙන්...

**05. ජීවිතමදෝ 06. ලාභමදෝ 07. සක්කාරමදෝ**

**අති පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමියන්ගේ**
**ලිපියක් ඇසුරිනි.**

# තුති කුසුම්



**පහත වැඩසටහන් සඳහා**
**ආධාර පරිත්‍යාග ලබා දුන් සුපින්වතුන් හට**
**මේ කරගත්තා වූ කුසලය නිවන් දක්නා ජාති දක්වා ම**
**ඔබ පසුපස එන සෙවනැල්ල සේ පවතීවායි ප්‍රාර්ථනා කරන්නෙමු !**

## 2017/01/08 සිට 2017/10/08 තෙක් මෙත් සවිය භාවනා වැඩසටහනට සහභාගීවන්නන් හට තේ පැන් සහ කෙටි ආහාරමය සංග්‍රහය සඳහා දායකත්වය දැරූ සුපිංවතුන්



2017/01/08 : මාලා මහත්මිය.
2017/01/15 : පද්මා පුංචිහේවා මහත්මිය.
2017/01/22 : රිචඩ් මහතා.
2017/01/29 : ප්‍රසාද් ඉපලවත්ත මහතා, නිරෝෂා ඉපලවත්ත මිය, තනූජා පෙරේරා මිය.
2017/02/12 : දිස්නා සමරනායක මිය, සුජීවා දීපානි මිය, නදීකා ප්‍රියදර්ශනී මිය.
2017/02/19 : ඉන්ද්‍රාණි මිය, රේණුකා මිය, සත්‍යා මිය
2017/02/26 : අංජලී වීරසුන්දර මිය, එන්. ඒ. කේ. ශාන්ති මිය, සාවිත්‍රී.
2017/03/19 : සී. හෙට්ටිආරච්චි මිය, ඒ. පනාගොඩ මිය ලලිත් වසන්ත මයා.
2017/03/26 : මධුරංග මහතා.
2017/04/09 : පද්මා පෙරේරා මිය, යූ. අබේසිංහ මිය.
2017/04/16 : අසරණ සරණ කමිටුව.
2017/04/23 : කාන්තා කමිටුව.
2017/04/30 : ශිරන්ත ඉලංගරත්න මහතා.
2017/05/14 : නූෂා වීරසිංහ මිය, එම්. එල්. නිල්මිණී මිය, හේලි අමා සෙනරත්, උදයංගනී.
2017/05/21 : කාන්තා කමිටුව, එල්. අබේසිංහ.
2017/05/28 : අසරණ සරණ කමිටුව.
2017/06/11 : කෞශිකා සිල්වා මිය, සමන්ත මයා,ශෂිකලා මිය.
2017/06/18 : දුචිත්‍රි පෙරේරා මිය, දමයන්ත පෙරේරා මයා.
2017/06/25 : මානෙල් සිරිවර්ධන මිය, ධම්මික සමරකෝන් මයා, රසික ඩයස් මයා, නෙළුම් දිඹුලාගල මයා.
2017/07/09 : රංජනී පරණවිතාන මිය, යූ. පී. බන්දුවතී මිය, පී. එල්. සැනිල්ස් මිය, පාලිකා පෙරේරා මිය, චාමර ප්‍රසාද් මයා, චාමර ප්‍රසාද් මයා, මධූෂා සමන්මලී මිය, ආලෝකා කුමාරි මිය.
2017/07/16 : ඒ. වී. බන්දුල ජයතිලක, අශෝක මහතා.
2017/07/23 : සමන්ති අහුබුදු මිය, සඳනි අහුබුදු මෙය.
2017/07/30 : චාමර මහතා.
2017/08/13 : කේ. එස්. දිල්රුක්ෂි මිය, එස්.ඒ. අචල උපාලි මයා, එස්.ඒ. ධර්මදාස මයා
2017/08/20 : එම්. ඒ. මදාරා සෙව්වන්දි මිය.
2017/08/27 : හෙට්ටිආරච්චි මිය, අනෝමා පනාගොඩ මිය, ජයසිංහ මෙන්ඩිස් මහතා.
2017/09/10 : මුදිත වික්‍රමසිංහ මයා, පියල් චන්ද්‍රතුංග මයා.
2017/09/17 : ගුණරත්න මහතා, චන්ද්‍රණී මිය, අමිතා මිය, බිනක රාජපක්ෂ මයා, දුමින්ද සමරසේකර මයා.
2017/09/24 : නිලන්ත කරුණාරත්න මයා.
2017/10/08 : පෙහංසා නෙත්මි ගම්මන්පිල.

## 2017 මැයි මස ගංවතුරින් නායයාම් වලින් විපතට පත් අයට ආධාර උපකාර කළ සුපිංවතුන්


| | | | |
|---|---|---|---|
| නිලංගනී කඹුරුගමුව | 74,000.00 | ලක්ෂ්මී හීනටිගල මිය | 1,000.00 |
| 2017.05.28 දින 36 වන කණ්ඩායමේ සමුහ පරිත්‍යාගය | 51,400.00 | අශෝකා ජයතිලක මිය | 1,000.00 |
| චන්දිම මාරසිංහ මයා | 10,000.00 | එන්. දහනායක මිය | 1,000.00 |
| මහාචාර්ය චන්දන ජයරත්න මහතා | 10,000.00 | ඒ. තලතා චාන්දනී ද සොයිසා මිය | 1,000.00 |
| රෝෂනාරා පෙරේරා | 10,000.00 | හේමක මාලා පෙරේරා | 1,000.00 |
| 2017.05.28 අධිමානසික කණ්ඩායමේ සමුහ පරිත්‍යාගය | 7,000.00 | තිලානි ලිවේරා මිය | 500.00 |
| ආර්.එම්. විතාන | 3,000.00 | ආලෝකා කුමාරි මිය | 500.00 |
| ප්‍රියංගිකා මුදන්නායක මිය | 2,000.00 | ඩබ්. සරත් සිල්වා මයා | 500.00 |
| නලනි වත්සලා මිය | 2,000.00 | නිරංගා මීදෙනිය මිය | 500.00 |
| සුරාපි දිල්රුක්ෂි මිය | 1,500.00 | තමරා සමරවීර මිය | 500.00 |
| එස්. එම්. වික්‍රමසිංහ මයා | 1,000.00 | ශෂිකා ප්‍රියදර්ශනී මිය/ එන්. ඒ. වී. එස්. රත්නායක | 500.00 |
| උදිතා ජයතිස්ස මිය | 1,000.00 | මානෙල් සමන්ලතා මිය | 500.00 |
| නිලාන් පෙරේරා මයා | 1,000.00 | පී. කේ. දළුගම | 500.00 |
| ඩබ්. එන්. ප්‍රියදර්ශනී මිය | 1,000.00 | කේ. ඒ. ඩි. යූ. දෙවන්ගා මිය | 200.00 |

## ශ්‍රී විජයාරාමයේ මෙත් සවිය සාමජික රථවාහන නවතා තැබීමට රථ ගාලක් සැකසීමට ආධාර උපකාර කළ සුපිංවතුන්...

| | | | |
|---|---|---|---|
| එම්. එන්. එස්. සිල්වා මහත්මිය - 28-4278 | 25.000/- | මහාචාර්ය චන්දන ජයරත්න මහාතා | 10,000/- |
| පියදාස සිල්වා මහතා | 20,000/- | | |

## අක්ෂි සායනය සඳහා ආධාර ලබාදීම

අක්ෂි සායනය සඳහා ඇස කණ්නාඩි රාමු 350 ක් ලබාදුන් කරඳවල මහතාට සහ එම මහත්මියටත්, ඇස් පරීක්ෂාකර තම මුදලින් කාච තනා පරිත්‍යාග කළ නුගේගොඩ සයින් ටෙක් ආයතනාධිපති නිලංගනී තෙන්නකොන් මැතිණියට මෙත් සවිය පුණ්‍යානුමෝදනාපූර්වක ස්තූතිය පුද කරමු.



## මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

# අසරණ සරණ ශිෂ්‍යත්ව අරමුදල

ආදර්ශ අයදුම් පත්‍රය

ශිෂ්‍යත්ව ප්‍රදානය කරන්නට කැමති පිංවතුන් විසින් පිරවීම පිණිසයි.

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: ක: 071 401 4467, 011 250 5088
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org

සාමාජික අංකය :..............................

දානපති / පතිනියගේ නම :..............................

ලිපිනය :..............................

දුරකථන අංක :..............................

මා විසින් මසකට රුපියල් 500 / 600 / 750 / 1000 / හෝ කැමති ගණනක් රු.............................. බැගින් වන ශිෂ්‍යත්ව .............................. ක් අවුරුදු .............................. තුළ දී හෝ දරුවන් උසස් අධ්‍යාපනය නිමා කරන තෙක් ලබා දීමට කැමති බැව් දන්වන අතර එම ශිෂ්‍යත්ව පිරිමි / ගැහැණු දරුවන් .............................. දෙනෙකුට ලබාදීමට කටයුතු යොදන ලෙස ඉල්ලමි. නැතහොත් මාස 3 කට / 6 කට / 12 කට වරක් එකවර එම මුදල




## 2017 / 04 / 30 සිට 2017 / 09 / 01 කාලය දක්වා මෙත්සවිය මඟින් සිදුකල ක්‍රියාකාරකම් වල සංක්ෂිප්ත වාර්තාව

- අප්‍රේල් 30 වන දින මහාචාර්යතුමා විසින් සියලුම කමිටු සාමාජිකයින් සඳහා පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන.
- මැයි 7 වන ඉරුදින විශ්වය සහ බුදු දහම වැඩසටහන මහාචාර්ය චන්දන ජයරත්න මහතා විසින් මෙහෙයවීම.
- මැයි 11 සිට 12 දක්වා බෞද්ධාලෝක වෙසක් කලාපයට සම්බන්ධ වී සත්ත්ව ඝාතනය වැලැක්වීමේ සී.ඩී. තැටි නොමිලයේ බෙදාදීම සහ ස්වයංජාත ඇල් සහල් බෙදාදීම.
- ජුනි 4 පළමු ඉරු දින මහාචාර්ය දයාරෝහණ අතුකෝරාල මහතාගේ ''ජීවිතය ජය ගන්නා අන්දම'' දේශනය පැවැත්වීම.
- ජුනි 4 පළමු ඉරු දින ගංවතුරින් අසරණ වූවන්ට වියළි ආහාර ද්‍රව්‍ය සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ අත්‍යවශ්‍යය ද්‍රව්‍ය කළුතර ප්‍රදේශයට ගෙනගොස් බෙදාදීම.
- ජූලි 1 වන පළමු ඉරුදින ''සාර්ථක පවුල් ජීවිතයක් පවත්වාගෙන යාම'' මැයෙන් කිරුළපන බළපොකුණ විහාරාධිපති ස්වාමීන්වහන්සේගේ ධර්ම දේශනාව සහ මහාචාර්ය චන්දන ජයරත්න මහතා විසින් දේශනයක් පැවැත්වීම.
- ජූලි 9 වන දින ප්‍රදීප් යහම්පත් මහතාගේ ''ස්පියර් හෙඩ්'' ආයතනය මගින් සියළුම මෙත්සවිය කමිටු සාමාජිකයින් සඳහා ''නායකත්ව පුහුණු හා පෞරුෂත්ව වර්ධන'' වැඩසටහනක් ආරම්භ කිරීම.
- ජූලි 30 වන දින ''නායකත්ව පුහුණු හා පෞර්ෂත්ව වර්ධන'' වැඩසටහනේ දෙවන අධියර ක්‍රියාත්මක කිරීම.
- අගෝස්තු 6 වන පළමු ඉරුදින රාජගිරිය කළපළුවාව නෙළුම් පෙදෙසේ දහම් මැදුර වාසී මකුලෑවේ සුදස්සන හිමිගේ ධර්ම දේශනය පැවැත්වීම.
- අගෝස්තු 27 වන දින ''නායකත්ව පුහුණු හා පෞර්ෂත්ව වර්ධන'' වැඩසටහනේ තෙවන අධියර ක්‍රියාත්මක කිරීම.
- සැප්තැම්බර් 1 සිට 5 දක්වා කාලය තුලදී මහියංගනය රාජමහා විහාරයේ පෙරහැර පවත්වන දියන්හිදී, ඉදිකරමින් පවතින සම්බුද්ධත්ව ජයන්ති බුද්ධ ප්‍රතිමා වහන්සේ සඳහා ආධාර ටිකට් පත්‍රිකා මෙත් සවිය සාමාජිකයින් විසින් විකිණීම.
- සැප්තැම්බර් 8 වන දින මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ ජන්ම දිනය නිමිති කොටගෙන මහා සංඝරත්නය සඳහා දහවල් දානය පිරිනැමීම හා සතුන් නිදහස් කිරීම.
- සැප්තැම්බර් 17 වන දින මෙත් සවිය හා මැද කොළඹ රොටරි සමාජය ඒකාබද්ධව අක්ෂි සායනයක් සහ ශ්‍රවණාධාර උපකරණ බෙදාදීමේ කඳවුරක් පැවැත්වීම.
- සැප්තැම්බර් 24 වන දින ''නායකත්ව පුහුණු හා පෞර්ෂත්ව වර්ධන'' වැඩසටහනේ සිව්වන අධියර ක්‍රියාත්මක කිරීම.
- සැප්තැම්බර් 30 - 1 යන දිනයන්හිදී මෙත් සවිය සඳහම් චාරිකාව සඳහා මෙත් සවිය සාමාජිකයින් සමඟින් මහියංගනය වෙත යෑම.

# IS THERE A BEST TIME TO SLEEP ?



There is a saying that sleeping early and waking up early is good for your health. How true is that? Is it alright to sleep late and wake up late?

You actually have an amazing biological clock ticking inside your body. It is very precise. It helps to regulate your various body functions including your sleeping time.

***From 11pm to 3am,*** most of your blood circulation concentrates in your liver. Your liver gets larger when filled with more blood. This is an important time when your body undergoes detoxification process. Your liver neutralizes and breaks down body toxins accumulated throughout the day.

***However if you don't sleep at this time, your liver cannot carry out this detoxification process smoothly.***

- **If you sleep at 11pm, you have full 4 hours to detoxify your body.**
- **If you sleep at 12am, you have 3 hours.**
- **If you sleep at 1am, you have 2 hours.**
- **And if you sleep at 2am, you only have 1 Hr to detoxify.**

***What if you sleep after 3am?*** Unfortunately, you won't have any time to actually detoxify your body. If you continue with this sleeping pattern, these toxins will accumulate in your body over time. You know what happens next.

***What if you sleep late and wake up late?***

Have you tried going to bed very late at night? Did you realize you feel very tired the next day no matter how much you sleep ?

Sleeping late and waking up late is indeed very bad for your health. Besides not having enough time to detoxify your body, you will miss out other important body functions too.

***From 3am to 5am,*** most blood circulation concentrates in your lung. What should you do at this moment? Well, you should exercise and breathe in fresh air. Good time for meditation too. Take in good energy into your body, preferably in a garden. At this time, the air is very fresh with lots of beneficial negative ions.

***From 5am to 7am,*** most blood circulation concentrates in your large intestine. What should you do at this moment? You should poop! Pass out all unwanted poop from your large intestine. Prepare your body to absorb more nutrients throughout the day.

***From 7am to 9am,*** most blood circulation concentrates in your stomach. What should you do at this moment?

Have your breakfast! This is your most important meal in a day. Make sure you have all the required nutrients from your breakfast. Not having breakfast causes lots of health problems for you in the future.

***That's the way to start your day***

No wonder people living in villages or in farms are healthier. They sleep early and wake up early as they follow their natural biological clock.

If one follows this you're sure to feel fresher and more energetic all day long.

*- Extracted from Healthcare article.*






**Barack Obama**

Barack Hussein Obama is the 44th President of the United States and also the first African Amencan to hold the office.

**He sleeps 6 hours a day.**



**Benjamin Franklin**

Franklin was a leading author, printer. poliUcal theorist politician, freemason, scientist inventor, civic activist and a diplomat.


**He used to sleep 7 hours a day.**



**Tim Armstrong**

He is the CEO and Chairman of AOL Inc. Previously, he was President of Google s Americas operation.

**He sleeps 6 hours a day.**



**Thomas Edison**

He was an American inventor and businessman. He developed many devices like phonograph & a long lasting, practical electric light bulb.

**He used to sleep 3 hours a day.**

# --- How to Train Yourself to Need Less Sleep ---

## SLEEP CYCLES CHANGE WITH AGE

| | Age 20 | Age 40 | Age 60 | Age 70 | Age 80 |
|---|---|---|---|---|---|
| Time to fall asleep | 16 minutes | 17 minutes | 18 minutes | 18.5 minutes | 19 minutes |
| Total sleep time | 7.5 hours | 7 hours | 6.2 hours | 6 hours | 5.8 hours |
| Time in regular sleep | 47% | 51% | 53% | 55% | 57% |
| Time in slow wave sleep | 20% | 15% | 10% | 9% | 7.5% |
| Time in REM sleep | 22% | 21% | 20% | 19% | 17% |
| Time asleep while in bed | 95% | 88% | 84% | 82% | 79% |

Sleep is vital for the brain and the body to function at their best, and when a person doesn't get enough of it, their brain can't repair or build new pathways, Buysse says. That makes it more difficult to retain information, engage in complex thinking and stay focused. Sleep deficiency has also been linked to physical health problems, such as obesity, high blood pressure and heart disease.

It is an old belief that an adult needs 7-9 hours of sleep. Still, it may be possible to teach yourself to get by on sleep less, according to Jim Horne, a sleep expert and former director of the Sleep Research Centre at Loughborough University in England. He argues the number of hours people need to sleep is more flexible from person to person and that concerns about not getting your nightly seven or eight hours are often overblown.

"I'm not advocating people get less sleep, but I'm advocating that people should not worry so much about not getting enough sleep," Horne said. "Especially if you're not sleepy in the day and you're having a fulfilling wakefulness, then you are getting enough sleep irrespective of how much you're getting."

Horne's research shows that people can cut down their regular sleep to about six hours a night, plus a short nap during the day, as long as they do it gradually. In one study, he asked people who regularly slept seven to 8.5 hours a night to shorten their sleep by going to bed a certain amount of time later each night. Volunteers started by pushing back their bedtime one hour during the first week, and then pushed it back by 1.5 hours for the next three weeks. After doing this and waking up at the same time each morning, people were able to successfully function—and get high-quality sleep—on just six to 6.5 hours of sleep each night.

Gradually going to bed later might work well for some, but Horne says he wouldn't recommend it for people who already feel like their sleep time is constricted. If you feel sleepy during the day, Horne said, then six hours is probably not enough for you. Instead, he says, focus on getting quality sleep rather than worrying about the quantity.

Making better use of your waking hours is another way to thrive on less sleep. Try exercising in the afternoon, says Sigrid Veasey, a professor at the Center for Sleep and Circadian Neurobiology at the University of Pennsylvania's Perelman School of Medicine. This will raise your body temperature and then cool it down by bed time, helping you fall asleep more quickly and sleep more deeply through the night. Other tips for optimizing your sleep include avoiding a large meal late in the evening,


making time to think about worries before bed so you don't go to sleep tressed, avoiding looking at screens right before you sleep and making sure the bedroom is dark and quiet.

These are good places to start if you want to make the most of the sleep you get. But if you're still feeling sluggish, only more sleep will help.

——————*- Extracted from TIME Health Newsletter*
*January 20, 2017*

## How to sleep 8 hours in 4 hours Get a Better Night's Sleep

**Practice Mettha Meditation at least 20 minutes per day and a sound sleep is guaranteed.**



# නිවේදන සහ නොමිලයේ පළකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

මෙත්සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපිද, දාන - ශීල - භාවනා වැඩසටහන්වල දී දායකත්වය දරන පිංවතුන් ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන් ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිලයේ පලකරනු ලැබේ. කොළ කැබලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තැබිය යුතුය. ඔබගේ ලිපිනය ලියා දීම සඳහා භාවනා වැඩසටහන්වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවල ද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබී යාම පිළිබඳව වගකියනු නොලැබේ.

## මෙත් සවිය දුරකතන අංක

මෙත් සවිය තොරතුරු විමර්ශනය කරනවිට, **පරිපාලන නිලධාරී මහතා අමතන්න. (011-2505088, 0714-014467).** එම දුරකතනවල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි.

අපගේ **වෙබ් අඩවි වන www.methsaviya.org** සහ **www.methsaviya.lk** මගින්ද තොරතුරු ලබා ගත හැකිය. මීට අමතරව සම ලේකම්වරු වන කෝසල විදිරිසිංහ මහතා (දු.ක : 071 632 2306) හෝ මංජුල පත්මකුමාර මහතා (දු.ක : 071 529 5855 අමතා ද හදිසි තොරතුරු ලබාගත හැක.

සංසදයේ **සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක 0714 800 800 හෝ 0777 309 385** මගින් **දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක්** (ඉතා හදිසි අවශ්‍යතාවයක දී සෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකථන පණිවුඩ 30 ක් පමණ ලැබෙන නිසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## මීළඟ 38 වන භාවනා වැඩසටහන

**38 වන භාවනා වැඩසටහන 2018 ජනවාරි මස 14 ඉරු දින ඇරඹීමට නියමිතය. ඒ සඳහා 2017/12/31 දින තෙක් නව අයදුම්පත් භාරගනු ලැබේ. තවද සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමාජිකයින්ට ද ඒ සඳහා සහභාගි විය හැක. සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.**

## පංච අභිඥා සහ අධිමානසික විද්‍යාව පිළිබඳ 35 වන වැඩමුළුව

**ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 34 වන වැඩමුළුව 2018 - 02 - 11 දින පෙරවරු 10.00 ට ආරම්භ වේ. 33 වන වැඩමුළුව සඳහා අයදුම්පත් 2018 - 01 - 31 දිනට පෙර භාරදෙන්න. ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මුලිකත්වය ලබා දේ.**

## සුව සෙත

**ප්‍රාණ / විශ්ව ශක්ති ක්‍රම මගින් සමහර රෝග සඳහා සිත දියුණු කරගත් පුද්ගලයින් විසින් රෝග සුවකිරීමේ නොමිලයේ පැවත්වෙන සුව සෙත වැඩසටහන ඉරු දිනවල දී, පෙ.ව. 11.00 - 2.00 දක්වා (මාසයේ පළමු ඉරු දින හැරෙන්නට) ශ්‍රී විජයාරාමයේ දී පැවැත්වේ. කාර්යයාලයෙන් විමසා පැමිණෙන්න.**


### දෙමළ භාෂාව

පාසල් යන දරුවන් සඳහා **නොමිලේ**
දෙමළ භාෂාව ඉගැන්වීම කරනු ලැබේ.
විජයාරාම විහාරස්ථානයේ දී
සෑම ඉරුදිනක ම
ප.ව. **2.00 - 4.00** දක්වා පැවැත්වේ.
**දුරකථන : 0714486680**
මෙත්සවිය සාමාජිකා - ආලෝකා කුමාරි - 19-3086

### ගණකාධිකරන හා මුල්‍ය සේවා

පලපුරුදු, වෘත්තීය ගණකාධිකාරිවරයෙකු වන
මෙත්සවිය සාමාජිකයකු තනි පුද්ගල/ හවුල් ව්‍යාපාර,
සමාගම් ඇතුළු සියලු ව්‍යාපාරවල විගණනය,
ගිණුම් පිලියෙලකිරීම්,
ආදායම් බදු හා මුල්‍ය කළමනාකරණ උපදෙස් හා
සේවාවන් සාධාරණ ගාස්තු යටතේ සපයනු ලැබේ.
**විස්තර : 077 2355117 අමතන්න.**

### දිදුලක ක්‍රියේෂන්ස්

විසිතුරු නිර්මාණ සමගින් අලංකාරවත් ලෙස
**මුතුකුඩ නිර්මාණය**
මනාලියන්ගේ සහ උත්සව අවස්ථාවන් සඳහා
**සාරි නිර්මාණය කරනු ලැබේ**
**සාමජිකා - දිලිනි**
බොරලැස්ගමුව - **0773904405**

ප්ලාස්ටික් ප්‍රතිශක්තිකරණය කර
පිගන්/ කෝප්ප / වට්ටි ආදිය තැනීම රැකියාව කරගත්
සාමාජිකාවකට (**සා.අංක. 34-5228**) නැගී සිටීමට අතහිත දෙන්න...
**ඔබ නිවසේ විසිකරන අනවශ්‍ය ප්ලාස්ටික් ද්‍රව්‍ය තිබේ නම්**
පොල්තෙල් බෝතල්/අයිස්ක්‍රීම් පෙට්ටි/ වතුර බෝතල් ආදිය
භාර දීමට විමසන්න - **0772 353 392**

### සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්

SIGHT 'N' STYLE OPTOMETRISTS

නො. 126 බී, හයිලෙවෙල් පාර, නුගේගොඩ.
(අනුලා විදුහල ඉදිරිපිට)
**(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න)**

Homestay
**FOR A COMFORTABLE STAY IN ANURADHAPURA**
#523/10, Maithreepala Senanayaka Mawatha, Dahaiyagama Handiya, Anuradhapura.
CONTACT : NIHAL FERNANDO - PHONE : 025-2220209, MOBILE : 071-4394481

# මෙත් සවිය මනස අධ්‍යාපන මෛත්‍රී සංසදය - සාමාජික අයදුම්පත

**(ඡායා පිටපත් ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)**

01. සම්පූර්ණ නම ....................

02. ස්ත්‍රී / පුරුෂ භාවය .................... 3. ජාතික හැඳුනුම්පත් අංකය ....................

(ඡායා පිටපතක් අමුණන්න)

04. උපන් දිනය .................... 5. වයස .................... 6. ආගම ....................

07. ස්ථිර ලිපිනය ....................

විද්‍යුත් තැපෑල (e-mail) .................... දු:කා: නිවස .................... ජංගම ....................

08. දිස්ත්‍රික්කය .................... 9. විවාහක / අවිවාහක බව ....................

10. දරුවන් සිටිනම් විස්තර : ගැහැණු දරුවන්ගේ වයස් .................... / පිරිමි දරුවන්ගේ වයස් ....................

11. රැකියා කරන්නේ නම්, ආයතනයේ නම .................... තනතුර ....................

(ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ....................

12. කාර්යාලීය විස්තර හා දුරකථන විස්තර ....................

13. ලිපි එවිය යුතු ලිපිනය ....................

14. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්,

1. ....................
2. ....................

15. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර,

1. ....................
2. ....................
3. ....................

16. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ....................

17. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද ? ඔව් / නැත .

18. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර.

....................

19. ඔබ විසින් සඳහන්කළ යුතු මෙහි දී වැදගත් යැයි හැඟෙන වෙනත් විස්තර හෝ යෝජනා / අදහස් තිබේ නම් මෙහි සඳහන් කරන්න. ....................

....................

**මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.**

දිනය .................... අයදුම්කරුගේ අත්සන ....................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය ....................

.................... ....................


තේරීම් කමිටු සභාපති විධායක ලේකම් දිනය ....................

සැ:යු:- ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශණ, වැඩමුළු, මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම්, හැඳුනුම්පත් සැකසීම, තැපැල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිළධාරී මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු. 2,500 /- ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (එය ඇතුළත්වීමේ ගාස්තුව රු. 1,500 /- හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500 /- X 2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය සඳහා තම ආදායම තහවුරු කළ හැකි ලිපි ලේඛන සහ තම විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නිර්දේශය සහිත ග්‍රාම නිලධාරිතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ) කාර්යාලය සඳුදා, අඟහරුවාදා, හැර සතියේ ඉතිරි දිනයන්හි සෙනසුරාදා, ඉරිදා ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සෑම කෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍යනම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 9X4 ප්‍රමාණයේ නම, ලිපිනය ලියූ මුද්දර කවර 2 ක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමු කරන්න. (අයදුම්පත සමග කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)

ලිපිනය :- ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 06, දුරකථන : 0112 505088, 0714 014467, www.methsaviya.org / www.methsaviya.lk

2017 වෙසක් මස
බෞද්ධාලෝක මාවත
වෙසක් කලාපයේ
ඉදිකරන ලද
මෙත් සවිය
ආධාර කුටිය






## මෙත් සවිය කමිටු සාමාජිකයින් සඳහා පැවැත් වූ නායකත්ව පුහුණු වැඩසටහන් මාලාවේ අවස්ථාවන් කිහිපයක්...




## 2017 මැයි මස ඇති වූ ගංවතුර ආපදාව හේතුවෙන් අසරණ වූ ජනතාව වෙත
## මෙත් සවිය මගින් පිසින ලද ආහාර හා වියළි ආහාර ද්‍රව්‍ය ලබා දීමේ සද්කාර්යයය









## 2017 සැප්තැම්බර් මස 21 වන දින, කොළඹ 06 - ශ්‍රී විජයාරාමයේදී පවත්වන ලද
## අක්ෂි සායනය, ඇස් කන්නාඩි ලබාදීම සහ ශ්‍රව්‍යාධාර උපකරණ ලබාදීම.












011 2827044 / 0712 285 680